වාර්ෂික වාර්තාව

ஆண்டறிக்கை

# ANNUAL REPORT

## 2015




කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
පේරාදෙණිය විශ්ව විද්‍යාලය

விவசாயப் பட்டப் பின் படிப்பு நிறுவனம்
பேராதனைப் பல்கலைக்கழகம்

**POSTGRADUATE INSTITUTE OF AGRICULTURE**
**UNIVERSITY OF PERADENIYA**

# වාර්ෂික වාර්තාව

# 2015




කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
පේරාදෙණිය විශ්ව විද්‍යාලය

## දැක්ම

ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයට හා ගෝලීය ප්‍රජාවගේ අවශ්‍යතා සපුරාලීම පිණිස කෘෂිකර්මාන්තයට හා එයට අදාළ අනෙකුත් අංශයන්හි පශ්චාත් උපාධි හා පර්යේෂණ කටයුතු කිරීමෙහි ලා විශිෂ්ඨත්වයකින් හෙබි කලාපීය මධ්‍යස්ථානයක් බවට පත් වීම.

## මෙහෙවර

පශ්චාත් අධ්‍යාපන හා පර්යේෂණ මධ්‍යස්ථානයක් ලෙස සිය සේවාව ලබා දෙමින්, උසස් ගුණාත්මක බවින් යුත් ඉගැන්වීම් හා පර්යේෂණ තුළින් අධ්‍යාපනික වශයෙන් උසස් ප්‍රායෝගිකත්වයට නැඹුරු වූ පුහුණුවක් ලබා දීම හා කෘෂිකර්මාන්තයට හා එයට අදාළ අනෙකුත් ක්ෂේත්‍රයන්ට ධනාත්මක දායකත්වයක් සපයන්නා වූ ප්‍රවීනතාවයෙන් හෙබි සේවයට කැප වූ වෘත්තිකයින් පිරිසක් බිහි කිරීම.

## ඉලක්ක

1. විශිෂ්ටත්වයෙන් හෙබි අධ්‍යයන ප්‍රමිතියක් අත් කර ගැනීම
2. පශ්චාත් උපාධි අධ්‍යයන හා පර්යේෂණ කටයුතුවල විශිෂ්ටත්වයක් අත්කර ගත් ජාතික හා අන්තර්ජාතික ආයතනයක් ලෙස පිළිගැනීමක් ලබා ගැනීම
3. පර්යේෂණ හා නව්‍යතා සංස්කෘතියක් ඇති කිරීම
4. මූල්‍යමය ශක්‍යතාවයෙන් යුත් ආයතනයක් බවට පත් වීම

# පටුන

පටුන

ආයතනයේ දැක්ම, මෙහෙවර හා ඉලක්ක i
ආයතනයේ සංවිධාන ව්‍යුහය ii
කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයෝ iii

අ. 2015.12.31 දිනෙන් අවසන් වූ වසර සඳහා ආයතනයේ ප්‍රගතිය පිළිබඳ අධ්‍යක්ෂතුමාගේ සමාලෝචන වාර්තාව 01
හැඳින්වීම 01
අධ්‍යයන හා පර්යේෂණ කටයුතු 01
වාර්ෂික සම්මේලනය 03
සාක්ෂාත් කර ගන්නා ලද ඉලක්ක 03
මුහුණ දුන් අසමාර්ථතා හා එයට බලපෑ සාධාරණ හේතු 04
අනාගත සැලසුම් 04

ආ. ආයතනික සම්පත් හා සිසුන් පිළිබඳ තොරතුරු 05

ඇ. 2015 දෙසැම්බර් මස 31 දිනට ආයතනයේ සිටි ස්ථිර කාර්ය මණ්ඩලය 07

2015 දෙසැම්බර් මස 31 දිනට ආයතනයේ සිටි ස්ථිර අනධ්‍යයන කාර්ය මණ්ඩලය 08

ඈ. පර්යේෂණ නිමැවුම් 08

2015 වර්ෂයේදී කරන ලද පර්යේෂණ, නව සොයා ගැනීම්, හා ප්‍රකාශන 08

2015 වර්ෂයේදී පවත්වන ලද වැඩසටහන්, සම්මන්ත්‍රණ ,සමුළු, හා වැඩමුළු 10

වාර්ෂික පර්යේෂණ සම්මේලනය 11

2015 වර්ෂයේදී පවත්වන ලද ඡාත්‍යන්තර සම්මන්ත්‍රණ, වැඩමුළු, පුහුණු වැඩසටහන් දැනුවත් කිරීමේ වැඩසටහන් සහ කෙටිකාලීන පාඨමාලා 14

2015 වර්ෂයේ දී අත්සන් කරන ලද ජාත්‍යන්තර ගිවිසුම් / අවබෝධතා ගිවිසුම් පිළිබඳ 14

2015 වර්ෂයේදී ආරම්භ කරන ලද නව පාඨමාලා පිළිබඳ විස්තර 15

කෘෂි විද්‍යාපීඨ පුස්තකාලයේ වාර්ෂික වාර්තාව 16

ආයතනයේ මූල්‍ය කාර්යය සාධනය – 2015 19
පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර 19
ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර 20

විගණන කමිටු වාර්තාව 21

## ආයතනික ව්‍යූහය




**කෙටි යෙදුම් :**

AR - සහකාර ලේඛකාධිකාරි
SAB - ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි
SA/P - පද්ධති විශ්ලේෂක
SPSD - අධ්‍යක්ෂතුමාගේ ජ්‍යෙෂ්ඨ පුද්ගලික ලේකම්

*** අධ්‍යයන මණ්ඩලය:**

කෘෂි ජීව විද්‍යාව
කෘෂි ආර්ථික විද්‍යා
කෘෂි ඉංජිනේරු විද්‍යා
කෘෂි ව්‍යාප්ති
සත්ව විද්‍යා
ව්‍යාපාර අධ්‍යයනය
ජීව සංඛ්‍යාන විද්‍යා
බෝග විද්‍යා
ආහාර විද්‍යා හා තාක්ෂණය
පැළෑටි ආරක්ෂණ
පාංශු විද්‍යා

**කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ කළමනාකරණ මණ්ඩලය (2015)**

1) මහාචාර්ය එස් සමිත - අධ්‍යක්ෂ කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය
2) ඩග්ලස් නානයක්කාර මහතා - අතිරේක ලේකම් (උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම් නියෝජනය කිරීම සඳහා)
3) ආචාර්ය ඒ ජේ සතරසිංහ -අධ්‍යක්ෂ ජනරාල්, ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව (මුදල් අමාත්‍යංශයේ ලේකම් නියෝජනය කිරීම සඳහා)
4) ආර් එම් ඩී බී මීගස්මුල්ල මයා, ලේකම්, කෘෂිකර්ම අමාත්‍යංශය නියෝජනය කිරීම සඳහා
5) ලේකම්,වැවිලි කර්මාන්ත අමාත්‍යංශය නියෝජනය කිරීම සඳහා
6) එච් එල් තිසේරා මයා, ලේකම් - පශු සම්පත් සංවර්ධන අමාත්‍යංශයේ ලේකම් නියෝජනය සඳහා
7) කේ ඒ අයි ඩී සිල්වා මයා  අධ්‍යක්ෂ ප්‍රතිපත්ති හා සැලසුම් ( පරිසර අමාත්‍යංශයේ ලේකම් නියෝජනය කිරීම සඳහා)
8) අනුර සතුරුසිංහ මයා - වන සංරක්ෂක - පර්යේෂණ හා අධ්‍යාපන - (වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා නියෝජනය කිරීම සඳහා)
9) ආචාර්ය ජේ ඩී සමරසිංහ - සභාපති (කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාව CARP)
10) ආචාර්ය රොහාන් විජේකෝන් - අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
11) ආචාර්ය ඩී ආර් ටී ජී රත්නායක මයා- අධ්‍යක්ෂ ජනරාල්, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
12) එන් කේ ඒ රූපසිංහ මයා - අධ්‍යක්ෂ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
13) ආචාර්ය එච් ඒ ජේ ගුණතිලක - අධ්‍යක්ෂ පොල් පර්යේෂණ ආයතනය
14) මහාචාර්ය කේ සමරසිංහ - පීඨාධිපති කෘෂිකර්ම විද්‍යාපීඨය පේරාදෙණිය විශ්ව විද්‍යාලය
15) මහාචාර්ය එස් සුබසිංහ - පීඨාධිපති කෘෂිකර්ම පීඨය රුහුණු විශ්ව විද්‍යාලය
16) ආචාර්ය ඒ ඩී අම්පිටියවත්ත - පීඨාධිපති කෘෂිකර්ම පීඨය සබරගමුව විශ්ව විද්‍යාලය
17) මහාචාර්ය ඩී බී ටී එස් ජී අත්තනායක - පීඨාධිපති කෘෂිකර්ම පීඨය වයඹ විශ්ව විද්‍යාලය
18) ආචාර්ය එම් ජී ටී එස් අමරසේකර - පීඨාධිපති කෘෂිකර්ම පීඨය රජරට විශ්ව විද්‍යාලය
19) ආචාර්ය පී සිවරාජා- පීඨාධිපති කෘෂිකර්ම පීඨය නැගෙනහිර විශ්ව විද්‍යාලය
20) ආචාර්ය එස් සිවචන්ද්‍රන්- පීඨාධිපති කෘෂිකර්ම පීඨය යාපනය විශ්ව විද්‍යාලය
21) මහාචාර්ය එච් බී එස් ආරියරත්න - පීඨාධිපති පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය පේරාදෙණිය විශ්ව විද්‍යාලය
22) මහාචාර්ය වී ඒ සුමණසිංහ - කෘෂි ජීව විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය
23) මහාචාර්ය එච් එල් ජේ වීරහේවා - කෘෂි ආර්ථික විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය
24) මහාචාර්ය ඊ ආර් එන් ගුණවර්ධන - කෘෂි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලය
25) ආචාර්ය එච් වී ඒ වික්‍රමසූරිය - කෘෂිකර්ම ව්‍යාප්තිය පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලය
26) මහාචාර්ය එච් ඩබ්ලිව් සිරිල් - සත්ව විද්‍යාව පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලය
27) ආචාර්ය ජී එල් පීරිස් - ජීව සංඛ්‍යාන විද්‍යාව පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලය
28) ආචාර්ය ශාමලා කුමාර් - ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලය
29) ආචාර්ය එච්එම් ජී එස් බී හිටිනායක - බෝග විද්‍යාව පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලය
30) මහාචාර්ය ඩී ජී එන් ජී විජේසිංහ - ආහාර විද්‍යාව පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලය
31) ආචාර්ය ඩී එම් ද කොස්තා - පැලෑටි ආරක්ෂණය පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලය
32) මහාචාර්ය ඒ එන් ජයකොඩි - පාංශු විද්‍යාව පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලය

**විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කරන ලද නියෝජිතයන්**

33) මහාචාර්ය ආර් ජී ද සිල්වා -
34) මහාචාර්ය බී එස් බී කරුණාරත්න
35) ආචාර්ය එස් එස් ඊ රණවන
36) ආචාර්ය ඩී බී ටී විජේරත්න මයා
37) මහාචාර්ය එස් කේ පින්නවල

# වාර්ෂික වාර්තාව – 2015
# කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
# පේරාදෙණිය විශ්වවිද්‍යාලය
# (2015 දෙසැ.31 දිනට)

## අ. අධ්‍යක්ෂකගේ විමර්ශන වාර්තාව

## හැඳින්වීම

1972 අංක 1 දරණ පැරණි ලංකා විශ්වවිද්‍යාල පණත යටතේ 1974 අංක 2 දරණ ව්‍යවස්ථාව මගින් 1975 ජුනි මස දී කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ස්ථාපිත කර ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයට අනුයුක්ත කරන ලදී. 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතෙහි විධිවිධාන ප්‍රකාරව ඉහත ව්‍යවස්ථාව ආඥාපනතක් ලෙස සලකා ඒ අනුව කොමිසම විසින් 1980 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක කරන ලද 1979 අංක 09 දරණ ව්‍යවස්ථාව පැනවීය. මෙම අද්විතීය ආයතනය පිහිටුවීමේ මූලික අරමුණ වූයේ පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා රට තුළ ශක්තිය වර්ධනය කිරීමත් එහි සීග්‍රයෙන් ප්‍රසාරණය වන කෘෂිකර්ම අංශයට යෝග්‍ය වන පුහුණු විද්‍යාඥයන් සැපයීමත්ය. මෙම ආයතනය පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුයුක්ත කොට ඇත.

## අධ්‍යයන වැඩසටහන්

සිය අරමුණු කරා ළඟා වනු පිණිස කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ශ්‍රී ලංකා ආර්ථිකයෙහි වර්තමානයට වැදගත් වන්නා වූ විවිධ ඉහළ උපාධි වැඩසටහන් සැලසුම් කර ඇත. එමෙන්ම රටට අවශ්‍ය වන ඉල්ලුමට සරිලන සේ වක්‍රලේඛ පවා සංශෝධනයට ලක් කර ඇත. වර්තමානය වන විට දර්ශනශූරී, ව්‍යාපාර පරිපාලනශූරී, දර්ශනපති සහ විද්‍යාපති උපාධි වැඩසටහන් 31ක් පිරිනැමීමට සමත්ව ඇත. පශ්චාත් උපාධි සිසුන් හට විශ්වවිද්‍යාල අධ්‍යයන වටපිටාව රිසිසේ අත්විඳිය හැකි වන ලෙස පූර්ණ කාලීන නේවාසික පුහුණුව කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇත. කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය මුහුණ දෙන වැදගත් අභියෝගයක් වනුයේ සිය අධ්‍යයන කටයුතු මෙන්ම පර්යේෂණ කටයුතු කෙරෙහි ප්‍රමාණවත් කාලයක් මිඩංගු කළ හැකි සහ තම තමන්ට අදළ විෂය ක්ෂේත්‍රවලට පුළුල් ලෙස නිරාවරණය විය හැකි විනය ගරුක හා කැප විය හැකි උත්සාහවන්ත පිරිසක් නිර්මාණය කිරීමයි. මෙම ආයතනයෙන් බිහිවන උපාධිධාරීන්ගෙන් බලාපොරොත්තු වන්නේ ඔවුන්ගේ එවන් කැපවීම් තුළින් තම ජීවිතවල වැදගත් කොටසක් බවට පත්විය යුතු ශක්තිමත් සේවා ආචාර ධර්ම වර්ධනය කිරීමයි.

ශ්‍රී ලංකා අධ්‍යාපන සුදුසුකම් සැකිල්ලෙහි (SLQF) නිර්දේශවලට සමාන වනසේ වර්ෂ 2017 සිට බලපැවැත්වෙන පරිදි ආයතනයෙහි දැනට පවතින රෙගුලාසි සංශෝධනය කර ඇත.

මෙම ආයතයෙන් පිරිනමනු ලබන උපාධි වැඩසටහන් වනුයේ;

- විද්‍යාපති/ව්‍යාපාර කළමනාකරණපති ඃ සම්මාන 5ක නිර්දේශිතයක් ඇතුලත් පාඨමාලා වැඩ
- විද්‍යාපති/ව්‍යාපාර කළමනාකරණපති ඃ වර්ෂයක කාල සීමාවක පර්යේෂණ ඇතුලත් පාඨමාලා වැඩ
- දර්ශනශූරී/ දර්ශනපති/ව්‍යාපාර පරිපාලනශූරීඃ පර්යේෂණ පමණි

ඉහත දැක්වෙන විද්‍යාපති උපාධි වැඩසටහන්වල නියැලෙන ඉල්ලුම් කරුවන් ඒ ඒ පාඨමාලාවලට අවශ්‍ය කරනු ලබන සම්මාන සුදුසුකම් සපුරා ඇත්නම් ඔවුනට පශ්චාත් උපාධි ඩිප්ලෝමා හෝ පශ්චාත් උපාධි සහතික පත් සුදුසුකම් මට්ටමෙන් ඉවත් වී යා හැකිය. ඒ අනුව සම්මාන 25ක් සම්පූර්ණ කරන අයට පශ්චාත් උපාධි ඩිප්ලෝමාවද, සම්මාන 20ක් සම්පූර්ණ කරන අයට පශ්චාත් උපාධි සහතික පත්‍ර සුදුසුකමද ලබා ගත හැකිය. ඉතා කෙටි කාල සීමාවක දී පශ්චාත් උපාධි සුදුසුකම් අවශ්‍ය වන අයදුම් කරුවන් හට එම අරමුණ සපුරා ගත හැකි වන සේ මෙම පශ්චාත් උපාධි සහතික පත්‍ර මට්ටමේ වැඩසටහන හඳුන්වා දෙනු ලැබුවේ ප්‍රථම වතාවටයි.

## ආචාර්ය මණ්ඩලය

ආචාර්ය මණ්ඩලයට පර්යේෂණ හා ඉගැන්වීමේ පුළුල් අත්දැකීම්වලින් හෙබි විශේෂිත වූ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් 300කට අධික ප්‍රමාණයක් ඇතුලත් වේ. මෙම ආචාර්ය මණ්ඩලයෙන් වැඩි පිරිසක් පේරාදෙණි විශ්වවිද්‍යාලයේ කෘෂිවිද්‍යා පීඨයට අනුයුක්ත වන අතර සෙසු අය විශ්වවිද්‍යාල පද්ධතියේ අනිකුත් විශ්වවිද්‍යාල, රාජ්‍ය දෙපර්තමේන්තු, පර්යේෂණ ආයතන, සංස්ථා, පුද්ගලික අංශයේ ආයතන, ජාත්‍යන්තර ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන නියෝජනය කරති.

2016 වසරේ දී අධ්‍යයන මණඩල 11ක් යටතේ සිසුන් 413ක් ලියාපදිංචිව සිටි අතර ඒ පිළිබඳ විස්තර පහත දැක් වේ.

| | |
|---|---|
| විද්‍යාපති | - 349 |
| ව්‍යාපාර කළමනාකරණපති | - 32 |
| දර්ශනශූරි සහ දර්ශනපති | - 32 |

2016 උපාධි ප්‍රදානෝත්සවයේ දී පශ්චාත් උපාධි වැඩසටහන් සාර්ථකව නිම කළ ශිෂ්‍යයන් හට උපාධි ප්‍රදානය සිදු කරන ලදී. ඒ පිළිබඳ සංඛ්‍යා සටහන් මෙසේය.

| | | | |
|---|---|---|---|
| දර්ශනශූරි | - 9 | දර්ශනපති | - 26 |
| විද්‍යාපති | - 224 | ව්‍යාපාර කළමනාකරණපති | - 23 |

## සානාභි ව්‍යවහාරික සංඛ්‍යානය පිළිබඳ විද්‍යාපති වැඩසටහන

සානාභි ව්‍යවහාරික සංඛ්‍යානය පිළිබඳ විද්‍යාපති වැඩසටහනෙහි ආරම්භය 2015 දී සිදු වූ අතර කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය හා යේසුආ තාක්ෂණික ආයතනය අතර අත්සන් කළ අවබෝධතා ගිවිසුම ප්‍රකාරව ජෛව සංඛ්‍යාන අධ්‍යයන මණ්ඩලයෙහි ආචාර්ය මණ්ඩලය විසින් පාඨමාලාවෙහි ඉගැන්වීම් කයුතුවල නිරත වන ලදහ.

## බෙදුණු උපාධි වැඩසටහන්

ශිෂ්‍යත්ව ලබා විදේශ විශ්වවිද්‍යාලවලට පිවිසෙන සිසුන් ටික දෙනෙක් අදාළ විශ්වවිද්‍යාලවල විශිෂ්ඨ ආචාර්යවරුන්ගේ අධීක්ෂණය යටතේ සිය උපාධි වැඩසටහන්වල පර්යේෂණ කොටස කරගෙන යති. කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයට පෙරළා පැමිණෙන ඔවුන් කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙහි දී සිය වැඩසටහන්වල සියළු අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ඔවුන්ගේ උපාධි පිරිනමනු ලබන්නේ පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසිනි.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය එරස්මස් වැඩසටහන යටතේ විදේශ පුහුණුව සඳහා සිසුවන් දෙදෙනෙකු තෝරා ගනු ලැබීය. ව්‍යාපාර පරිපාලන අධ්‍යයන මණ්ඩලය යටතේ ව්‍යාපාර කළමනාකරණපති පශ්චාත් උපාධිය හදාරන සංජය මහතා සහ ආහාර විද්‍යා අධ්‍යයන මණ්ඩලය යටතේ විද්‍යාපති උපාධිය හදාරන එච් අබේවික්‍රම මහත්මිය යන දෙදෙනාට පිළිවෙලින් ලැට්වියාහි රිගා තාක්ෂණික විශ්වවිද්‍යාලයෙහි ද තුර්කි විශ්වවිද්‍යාලයෙහි ද ත්‍රෛමාසික

පුහුණුවක් ප්‍රදානය කරන ලදී. මෙම විශ්වවිද්‍යාලවල දී හදාරනු ලබන පාඨමාලා හා උපයා ගනු ලබන සම්මාන කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙහි උපාධි වැඩසටහන්වල කොටසක් ලෙස සලකා ක්‍රියා කරනු ලැබේ.

## පර්යේෂණ

### පර්යේෂණ පහසුකම් සැලසීමේ අරමුදල

දිවයිනෙහි ජාතික වශයෙන් වැදගත්කමක් උසුලන පර්යේෂණ පැවැත්වීමේ අරමුණ ඇතිව 2010 වසරේ දී ස්ථාපිත කරන ලද පර්යේෂණ පහසුකම් සැලසීමේ අරමුදල යටතේ 2016 වසරේ දී දර්ශනූරි සහ දර්ශනපති පර්යේෂණ කටයුතු සඳහා ආයතනය විසින් රු.මිලියන 13.5ක් වැය කොට ඇත.

### පර්යේෂණ හා සබැඳි ප්‍රකාශන අරමුදල

2016 වසරේ දී පවත්වන ලද එතෙර ජගත් සමුළුවලට පර්යේෂණවලින් නිර්මිත ලිපි ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි සිසුන් 6 දෙනෙක් තෝරා ගත්හ. එසේ තෝරා ගත් සිසුන්ගේ සංචාරක වියදම් ආදියට ආයතනයේ අනුග්‍රහය හිමි විය.

### කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි සිසුන්ගේ සංගමය

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි සිසුන්ගේ සංගමය විසින් කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතන දිනයක් 2016 මාර්තු මස 19 වැනි දින පවත්වන ලදී. දවස පුරා පැවැති මෙම වැඩසටහනෙහි පෙරවරු කාලයෙහි සැසිය විශ්වවිද්‍යාල ක්‍රීඩා භූමියෙහි පැවැති අතර නියෝජ්‍ය උපකුලපති මහාචාර්ය බී එල් විජේවීර මහතා විසින් ජාතික කොඩිය ද ආයතනයේ අධ්‍යක්‍ෂවරයා විසින් විශ්වවිද්‍යාල කොඩිය ද ඔසවමින් එහි සමාරම්භක උත්සවය සනිටුහන් කරන ලදී. සිසුන්, අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සහභාගිත්වයෙන් පැවැති මෙම වැඩසටහනට විනෝදාත්මක අංග රාශියක් ඇතුලත් විය. කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙහි උඩු මහලෙහි පැවැති සංධ්‍යා උත්සවය අති උත්කර්ෂවත් එකක් විය.

තවද මෙම සංගමය විසින් යහ පාලනය පිළිබඳ සම්මන්ත්‍රණයක් ද සැප්තැම්බර් මස 10 වැනි දින විද්‍යා පශ්චාත් උපාධි ආයතන ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී. මෙහි දී ඉංදියානු මහ කොමසාරිස් ශ්‍රී ලංකා නියෝජිත සහකාර කොමසාරිස් ගරු රාධා වෙන්කතරාමන් මැතිණිය සහ කෘෂි ව්‍යාපෘති අධ්‍යයන මණ්ඩලයේ සභාපති ආචාර්ය ඩබ් ජයතිලක ආගන්තුක දේශන පැවැත් වූහ.

ශ්‍රී ලංකා පත්‍රකලාවේදීන්ගේ සංවර්ධන සංසදය හා එක්ව කෘෂි ව්‍යාපෘති අධ්‍යයන මණ්ඩලය යෞවනයන් සඳහා ප්‍රථම ජාතික වීඩියෝ සම්මන්ත්‍රණය කොළඹ ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී පැවැත් විය. ප්‍රජා වීඩියෝ ජාතික මට්ටමේ තරඟයෙන් කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සිසුවෙකුට සම්මානයක් හිමි විය. ඊට අමතරව කෘෂි ව්‍යාපෘති අධ්‍යයන මණ්ඩලය යටතේ පුහුණු වන සිසුන් සඳහා සහයෝගීතා ක්‍රියාකාරකම් සංවිධානය කරන ලදී.

### වාර්ෂික සමුළුව

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 28 වැනි වාර්ෂික සමුළුව 2016 නොවැම්බර් මස දී ගන්නෝරුව ශාක ජාන සම්පත් මධ්‍යස්ථානයේ දී පැවැත් වීය. ආචාර්ය එම් ආරියරත්න සමුළු සමායෝජක ලෙස කටයුතු කළේය.

## ජයග්‍රහණ

### ශිෂ්‍ය ජයග්‍රහණ

ශිෂ්‍යයන් කිහිප දෙනෙකුගේ පර්යේෂණ ලිපි එතෙර ජාත්‍යන්තර සම්මන්ත්‍රණවලට තෝරාගෙන හෝ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා ගෙන ඇත. එසේම තවත් කිහිප දෙනෙකුගේ පර්යේෂණ පත්‍රිකා *Tropical Agricultural Research Journal* සඟරාවේ සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලීය *Ipurse Journal* සඟරාවේ පළ කිරීමට තෝරා ගෙන ඇත.

### එකඟතාවන්

පේරාදෙණිය විශ්වවිද්‍යාලය, කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, ජපානයේ යමගුචි විශ්වවිද්‍යාලය සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අතර අධ්‍යයන සහ අධ්‍යාපනික සබඳතාවන් වැඩි දියුණු කිරීමටත් පාර්ශව අතර මිත්‍ර සබඳතා ඉහළ නැංවීමටත් අවබෝධතා ගිවිසුමකට එළඹ ඇත.
ජපානයේ ඔසාකා ප්‍රිෆෙක්ච විශ්වවිද්‍යාලයේ සහාය මහාචාර්ය වරයෙක් වන මහාචාර්ය කවටේ ගේ සභාපතිත්වයෙන් යුත් නියෝජිත කණ්ඩායමක් කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට පැමිණියේ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය හා ජපානයේ ඔසාකා ප්‍රිෆෙක්ච විශ්වවිද්‍යාලය අතර අධ්‍යාපනික සහායෝගීතාව වර්ධනය කිරීමේ අරමුණ පෙරදැරි කර ගෙනය.

සාගා විශ්වවිද්‍යාලයේ මහාචාර්ය වරයෙක් වන මහාචාර්ය කේ. වටනබේ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට පැමිණියේ විශ්වවිද්‍යාල ද්විත්වය අතර සහයෝගීතාව තවදුරටත් වර්ධනය කිරීම පිණිසය.

### දේශගුණික වෙනස්කම්වලට අනුරූපවීම සඳහා වම්බටුවල පූර්ව අභිජනනයට ශෂ්‍ය වන ද්‍රව්‍ය භාවිතය පිළිබඳ ව්‍යාපෘතිය

ගෝලීය ශෂ්‍ය විවිධත්ව භාරකාර මණ්ඩලයෙහි ආචාර්ය බෙන්ජමින් කිලියන් (ප්‍රදායකයාගේ නියෝජිත) සහ තායිවානයේ ලෝක එළවළු මධ්‍යස්ථානයේ කෘමි ප්‍රතිරෝධය සඳහා එළවළු වර්ගය නම් වූ ආයතනයෙහි ආචාර්ය මොහොමඩ් රාබාගේ සහභාගිත්වයෙන් ස්පාඤ්ඤයේ අයිවරි කොස්ට් සමග සම්බන්ධතාවයෙන් කරගෙන යන ලද වම්බටු පූර්ව අභිජනන ව්‍යාපෘතියෙහි අවසාන විමර්ශන රැස්වීම 2016 නොවැ. 25 සිට 27 දක්වා ස්පාඤ්ඤයේ වෙලන්සියාහි දී පවත්වන ලදී. ගෝලීය ශෂ්‍ය විවිධත්ව භාරකාර මණ්ඩලය මෙම ත්‍රෛයි ජාතික ව්‍යාපෘතියේ සාර්ථකත්වය ඉහළ අගැයීමට ලක් කළේය. කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය නියෝජනය කළේ ආචාර්ය ආර් එම් ෆොන්සේකා මහත්මිය විසිනි.

## අසමත් වීම්

2016 වසරේ දී ආයතනය කැපී පෙනෙන අභියෝග කිසිවකට මුහුණ දුන්නේ නැත. විදේශ සිසුන්ගේ මද නේවාසික පහසුකම් ආයතනයෙන් පිරිනමනු ලබන උපාධි වැඩසටහන්වලට අයැදුම් කිරීම අධෛර්යමත් කිරීමට හේතුවක් වී ඇති බව පෙනී යයි.

## අනාගත සැලසුම්

### විදේශ සිසුන්

මෙම ආයතනයෙහි විවිධ වූ වැඩසටහන් සඳහා විදේශ ශිෂ්‍යයන්ගේ සංඛ්‍යාව ඉහළ නැංවීමට සැලසුම් කර ඇත.

### කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කොළඹ ශාඛාව

මෙම ආයතනය විසින් එහි කොළඹ ශාඛාව විවෘත කිරීමට ඉදිරිපත් කර ඇති යෝජනාව අදාළ අධිකාරීන් විසින් පිළිගෙන ඇත. විවිධ අධ්‍යාපන ආයතන සමග සාකච්ඡා කොට එය කොළඹ පදනම් ආයතනයේ ස්ථානගත කිරීමට තීරණය කර ඇති අතර නව ශිෂ්‍ය ප්‍රවේශය සමගින් 2017 පෙබරවාරි මස දී එම ශාඛාව උත්සවාකාරයෙන් විවෘත කිරීමට අදහස් කරයි.

### එතෙර කාර්ය මණ්ඩලය

FAO අරමුදල් භාවිතා කරමින් පශ්චාත් උපාධි වැඩසටහන් පිරිනැමීමට කෙටිකාලීන පදනම මත විදේශ විශ්වවිද්‍යාලවල විද්වතුන්ට ආරාධනා කිරීමට යෝජනා ඉදිරිපත් වී ඇත. ආරාධනා කරනු ලබන ආචාර්යවරුන්ගේ විශේෂඥ දැනුමැති ක්ෂේත්‍ර පිළිබඳ සොයා බැලීමටත් කුමන පාඨමාලා ඔවුන්ට පැවරිය යුතුද යන්න පිළිබඳව කටයුතු කිරීමටත් අධ්‍යන මණ්ඩල එකඟතාවකට පැමිණ ඇත.

## ආ. නව ශිෂ්‍ය ප්‍රවේශය හා ශිෂ්‍ය බඳවා ගැනීම්

### ආ. 1 සම්පත් හා ශිෂ්‍යයන් පිළිබඳ තොරතුරු – (2015 දෙසැ. 31 දිනට)

| අධ්‍යයන වැඩසටහන | මුළු ශිෂ්‍යය සංඛ්‍යාව | කාර්ය මණ්ඩලයේ ව්‍යාප්තිය (සත්‍ය ස්ථිර කාර්ය මණ්ඩලය පමණි) | | | |
|---|---|---|---|---|---|
| | | අධ්‍යයන | අනධ්‍යයන | අධ්‍යයන සහාය | එකතුව |
| අනියම් | 8 | 1 | 40 | 1 | 42 |
| දර්ශනපති (CR) | 26 | | | | |
| දර්ශනපති (R) | 3 | | | | |
| විද්‍යාපති | 316 | | | | |
| එම්.බී.ඒ | 34 | | | | |
| දර්ශනශූරි (CR) | 1 | | | | |
| දර්ශනශූරි (R) | 7 | | | | |
| එකතුව | **395** | **1** | **40** | **1** | **42** |

සමාලෝචිත වසරෙහි ලියාපදිංචි වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව සහ සත්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු ඉහත දක්වා ඇති වගුවෙන් පැහැදිලි වේ. (අනුමත වී ඇති සේවක සංඛ්‍යාව අනුව ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති, පරිසනක යෙදුම් සහකාර, සහ කම්කරු යන තනතුරු පුරප්පාඩු වී පවතිණි. හැකි ඉක්මනින් එම පුරප්පාඩු පිරවීම සඳහා ආයතනය විසින් නිසි පියවර ගෙන ඇත).

ආ. 2 පශ්චාත් උපාධි වැඩසටහන්වල නියැලි දේශීය ශිෂ්‍ය තොරතුරු - 2015

| අධ්‍යයන වැඩසටහන | පූර්ණ කාලීන/ **F** අර්ධ කාලීන/ **P** | නව ප්‍රවේශය (**2015** ජන - දෙසැ. දක්වා) | | | මුළු ශිෂ්‍ය බඳවා ගැනීම් (2015 දෙසැ. 31 දිනට මුළු ශිෂ්‍ය ලියාපදිංචිය) | | | 2015 දෙසැ. 31 දිනට මුළු එකතුව | උපාධි ලැබූ සංඛ්‍යාව* | | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | පි | ගැ | එකතුව | පි | ගැ | එකතුව | | පි | ගැ | |
| විද්‍යාපති | F | 121 | 195 | 316 | 178 | 165 | 343 | 659 | 118 | 147 | 265 |
| එම්.බී.ඒ | F | 19 | 15 | 34 | 126 | 57 | 183 | 217 | 17 | 06 | 23 |
| දර්ශනපති (CR) | F | 10 | 16 | 26 | 36 | 34 | 70 | 96 | 02 | 09 | 11 |
| දර්ශනපති (R) | F | 2 | 1 | 3 | 11 | 6 | 17 | 20 | 02 | 00 | 02 |
| දර්ශනශූරී (CR) | F | 0 | 1 | 1 | 24 | 13 | 37 | 38 | 00 | 00 | 00 |
| දර්ශනශූරී (R) | F | 4 | 3 | 7 | 45 | 31 | 76 | 83 | 04 | 05 | 09 |
| ප. උ. ඩිප්ලොමා | F | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 04 | 07 | 11 |
| අනියම් | | 4 | 4 | 8 | 0 | 0 | 0 | 8 | 0 | 00 | 00 |
| **එකතුව** | | **160** | **235** | **395** | **420** | **306** | **726** | **1121** | **147** | **174** | **321** |

* 2015 වසරේ දී පවත්වන ලද අවසන් පරීක්ෂණ අනුව පශ්චාත් උපාධි ලැබූ සිසුන් සංඛ්‍යාව සහ සමාලෝචිත වසරෙහි පශ්චාත් උපාධි වැඩසහන්වලට ලියාපදිංචි වූ සිසුන් සංඛ්‍යාවෙහි මෙන්ම උපාධි ලැබූවන්ගේ සංඛ්‍යාවෙහි ද සුළු අඩු වීමක් දැකිය හැකිය. එහෙත් දර්ශනශූරී උපාධි වැඩසටහන ඊට අදාළ නොවේ. මෙම වසරෙහි උපාධි ලැබූ පිරිසට 2009, 2007, සහ 2004 යන වර්ෂවල පිළිවෙලින් විද්‍යාපති/ එම්.බී.ඒ, දර්ශනපති සහ දර්ශනශූරී යන උපාධි වැඩසහන්වලට ලියාපදිංචි වූ ශිෂ්‍යයන් ඇතුලත් වේ.




රූප සටහන 1 - 2013, 2015 සහ 2015 වසරවල ශිෂ්‍ය ලියාපදිංචිය




රූප සටහන 2 - 2013, 2015 සහ 2015 වසරවල උපාධි ලැබීම්

ආ.3 පශ්චාත් උපාධි වැඩසටහන්වල නියැලි විදේශීය ශිෂ්‍ය තොරතුරු - 2015

| අධ්‍යයන වැඩසටහන | පූර්ණ කාලීන/ අර්ධ කාලීන | නව ප්‍රවේශය (2015 ජන. - දෙසැ. 2015) | | | මුළු ශිෂ්‍ය බඳවා ගැනීම් (2015 දෙසැ. 31 දිනට මුළු ශිෂ්‍ය ලියාපදිංචිය) | | | උපාධි ලැබූ සංඛ්‍යාව* |
|---|---|---|---|---|---|---|---|---|
| | | පි | ගැ | එකතුව | පි | ගැ | එකතුව | |
| දර්ශනශූරී | පූර්ණ කාලීන | 01 | - | 01 | 01 | 02 | 03 | 02 |
| විද්‍යාපති | පූර්ණ කාලීන | 01 | - | 01 | 01 | - | 01 | |

* 2015 වසරේ දී පවත්වන ලද අවසන් පරීක්ෂණ අනුව පශ්චාත් උපාධි ලැබූ විදේශ උපාධිධාරීන් -

පසුගිය වසර හා සසඳන විට මෙම වසරේ දී පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා විදේශ සිසුන්ගේ ප්‍රවේශය සතුටුදායක මට්ටමක නොවීය. ශෂ්‍යවිද්‍යා අධ්‍යයන මණ්ඩලය යටතේ දර්ශනශූරී සහ විද්‍යාපති වැඩසටහන්වලට එක් සිසුවෙක් බැගින් පමණක් ලියාපදිංචිය ලැබ සිටියේය. විද්‍යාපති වැඩසටහනට ලියාපදිංචි වූ ශිෂ්‍යයා එය අතහැර දමා ඇති අතර අනිත් සිසුවා දැනට දර්ශනශූරී වැඩසටහන කරගෙන යයි. කෙසේ වෙතත් දර්ශනශූරී වැඩසටහනෙහි නියැලුණු සිසුන් දෙදෙනා ජෛව සංඛ්‍යානය අධ්‍යයන මණ්ඩලය යටතේ උපාධි ලැබූහ.

## ඇ. කාර්ය මණ්ඩල තොරතුරු

ඇ. 1 අධ්‍යයන කාර්ය මණ්ඩල තොරතුරු - 2015 දෙසැ 31 දිනට (ස්ථිර කාර්ය මණ්ඩලය පමණි)

| දෙපාර්තමේන්තුව/ ඒකකය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | | මහාචාර්ය | | සහාය මහාචාර්ය | | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය | | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 2 ශ්‍රේණිය | | කථිකාචාර්ය | | ආධුනික කථිකාචාර්ය | | අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පි | ගැ | පි | ගැ | පි | ගැ | පි | ගැ | පි | ගැ | පි | ගැ | පි | ගැ | පි | ගැ | පි | ගැ |
| පරිපාලන | | | 1 | | | | | | | | | | | | | | 1 | |

පි - පිරිමි ගැ - ගැහැණු

ආයතනය හිමිකම් කියන ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව දෙකක් වුවත් ජ්‍යෙෂ්ඨ පුස්තකාලයාධිපති තනතුර පරප්පාඩුව පැවතියේ සුදුසු ඉල්ලුම්කරුවන් ඒ සඳහා ඉදිරිපත් නොවීම නිසාය. මුලු විශ්වවිද්‍යාලයේම පුරප්පාඩු පිරවීම පිළිබඳව පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණය මත යථා කාලයේදීම විශ්වවිද්‍යාලය මගින් මෙම පුරප්පාඩු පිරවීමට පියවර ගනු ඇත.

ඇ. 2 ස්ථිර අනධ්‍යයන කාර්ය මණ්ඩල තොරතුරු (2015 දෙසැ. 31 දිනට)

| පීඨය/ දෙපාර්තමේන්තුව/ ශාඛාව | කාර්ය මණ්ඩල සංඛ්‍යාව | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අති ජ්‍යෙෂ්ඨ[1] | | ජ්‍යෙෂ්ඨ[2] | | කනිෂ්ඨ [3] | | සුළු සේවක[4] | | එකතුව | |
| | පි | ගැ | පි | ගැ | පි | ගැ | පි | ගැ | පි | ගැ |
| පරිපාලන | - | 2 | - | 1 | 3 | 2 | 9 | 1 | **12** | **6** |
| ලියාපදිංචි | - | - | - | 1 | 3 | - | 1 | - | **4** | **1** |
| ගිණුම් | | 1 | - | 1 | 5 | - | 1 | - | **7** | **1** |
| පරිගණක ඒකකය | 1 | - | - | - | 1 | - | 1 | - | **3** | **-** |
| පුස්තකාලය | - | - | - | - | - | 3 | 3 | - | **3** | **3** |

*1- පරිපාලන/විධායක හා සමාන*
*2- ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික ශ්‍රේණි*
*3- ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි*
*4- ඉහත ශ්‍රේණිවලට වඩා පහළ*

වසර අග භාගයේ දී අනධ්‍යයන සේවක මණ්ඩලයේ කම්කරු තනතුරක් පුරප්පාඩු වූ අතර එය පිරවීම සඳහා දැනටමත් පියවර ගෙන ඇත.

## ඈ. පර්යේෂණ නිමැවුම්

### ඈ. 1 2015 වසරේ දී නිමැ වූ ප්‍රකශන

ඈ. 1 (අ) 2015 වසරේ දී අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් නිම කරන ලද ප්‍රකාශන

| පීඨය | ප්‍රකාශන වර්ගය | | සංඛ්‍යාව | | සටහන් |
|---|---|---|---|---|---|
| | | | ප්‍රකාශිත (දේශීය) | ප්‍රකාශිත (විදේශීය) | |
| | සූචක සඟරාවල පළ වූ පූර්ණ පත්‍රිකා* ප්‍රමාණය | | 03 | 01+01* | - |
| | නිර්දේශිත නොවන සූචක සඟරාවල පළ වූ පූර්ණ පත්‍රිකා ප්‍රමාණය | | - | - | - |
| | නිර්දේශිත නොවන සඟරාවල පළ වූ පූර්ණ පත්‍රිකා ප්‍රමාණය | | - | - | - |
| | සමුළු කාර්ය වාර්තාවල පූර්ණ පත්‍රිකා ලෙස පළ වූ සමුළු පත්‍රිකා ප්‍රමාණය<br><br>(සමුළු පත්‍රිකා 30 + සහ ජේ. වි. පර්යේෂණ සැසිය 05 ++) | | පත්‍රිකා 28 +<br>පෝස්ටර් 12<br><br>පත්‍රිකා 05 ++ | - | - |
| | උද්ධෘත ප්‍රකාශන ප්‍රමාණය | | - | - | - |
| | පළ වූ පොත් පරිච්ඡේද ප්‍රමාණය | | 4 | - | - |
| | පළ වූ පොත් ප්‍රමාණය | ප්‍රකාශක විසින් | - | - | - |
| | | කතෘ විසින් | - | - | - |

*ඉංදියාවේ ජාතික පෝෂණ ආයතනය, සාර්ක් ප්‍රාදේශීය ආහාර මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද සාර්ක් ජාත්‍යන්තර ආහාර දත්ත සමුළුවට ඉදිරිපත් කරන ලද පෝස්ටර් ප්‍රදර්ශනය

ඇ. 1 (ආ) සූචක සඟරාවල පළ කරන ලද පූර්ණ පත්‍රිකා ලේඛණය - 2015

| පත්‍රිකා මාතෘකාව | ප්‍රධාන කතෘගේ නම | උප කතෘගේ නම | සඟරාවේ නම |
|---|---|---|---|
| වෙනස් ජල කළමනාකරණ පාලන තත්ත්ව යටතේ වී වගා ජීවන චක්‍රයේ දී විවිධ පටක අතර M,P, K සහ ජෛව ස්කන්ධයෙහි එකතු වීම හා බෙදී යාම, | KATN සෝමවීර | LDB සූරියගොඩ<br>DN ද සිරිසේන<br>WAJM කොස්තා | Plant & Soil 401:169-183 |
| ශ්‍රී ලංකාවේ යාපනය ප්‍රදේශයට විශේෂ අවධානය යොමු කරමින් හයිඩ්‍රොපොනික ක්‍රියාවලිය යටතේ බීජ අවධියේ දී ලවණවලට ඔරොත්තු දීමේ හැකියාව අරමුණු කොට සුලබව වී වගා කරනු ලබන ගොවීන් පිරික්සීමට ලක් කිරීම | L ප්‍රදීපන් | SP නිශ්ශංක<br>LDB සූරියගොඩ | Int. Journal of Agronomy and Agric. Research 7: 1-13 |
| බීජ රෝපන දින විචලතාව මගින් අස්වැන්න ඉහළ නැංවීම හා වීවල (Oryza sativa L) ජල ඵලදායීතාව | PPRK අමරසිංහ | LDB සූරියගොඩ<br>BGDS මාරඹේ<br>LW ගලගෙදර<br>R පුණ්‍යවර්ධන<br>GLLP සිල්වා<br>U නයිදුමෝලු<br>M හෝදන් | Agricultural Water Management 160:132-143 |
| විවිධ ශෂ්‍ය කළමනාකරණ ක්‍රම යටතේ ස්වාභාවික උෂ්නත්ව අනුක්‍රමණය ඉහළයෑමට මුංවලින් (Vigna radiate (L.) R.Wilczek) ඇති ප්‍රතිචාර | MAPWK මලවිආරච්චි | WJM ද කොස්තා<br>JBDAP කුමාර<br>LDB සූරියගොඩ<br>RM ෆොන්සේකා | Journal of Agronomy and Crop Science, 202:1, 51-68 |

ඇ. 2 විද්‍යා හා තාක්ෂණ සංවර්ධන නිමැයුම් පිළිබඳ තොරතුරු - 2015
(කිසිවක් නැත)

| වර්ගය | දියුණු කළ ප්‍රමාණය | පැවරූ/වාණිජකරණය කළ/ප්‍රකාශ කළ ප්‍රමාණය |
|---|---|---|
| නව නිපැයුම්/සැකසුම් සංවර්ධනය | කිසිවක් නැත | |
| භාවිතයේ පවතින නිපැයුම්/සැකසුම්හි ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම් | | |
| නව ශාක ප්‍රභේද /දෙමුහුන් වර්ග/ශුද්ධ ජෛන්ද්‍රියය පදනම් කරගත් නිෂ්පාදන/ සංවර්ධනය කිරීම | | |
| ආයාත ආදේශන සංර්ධනය | | |
| දියුණු කළ මූලාකෘති සැලසුම් කිරීම | | |
| වෙනත් (සඳහන් කරන්න) | | |

ඇ .3 පේටන්ට් බලපත්‍ර පිළිබඳ තොරතුරු - **2015** (කිසිවක් නැත)

| පීඨය | වර්ගය | සංඛ්‍යාව | | සටහන් |
|---|---|---|---|---|
| | | ජාතික | ජාත්‍යන්තර | |
| | සම්පූර්ණ කරන ලද පේටන්ට් බලපත්‍ර සංඛ්‍යාව | **කිසිවක් නැත** | | |
| | ලැබූ පේටන්ට් බලපත්‍ර සංඛ්‍යාව | | | |
| | බලපත්‍ර ලැබූ/විකුණන ලද/පවරන ලද පේටන්ට් සංඛ්‍යාව | | | |

## ඇ. 4 2015 වසර තුළ පොදු මහජනතාව උදෙසා බෙදහරින ලද දැනුම පිළිබඳ තොරතුරු

මෙම වසරෙහි දී වැඩමුළු, කෙටිකාලීන පාඨමාලා, සහ පුහුණු සැසි වැනි වැඩසටහන් 9ක් සංවිධානය කරන ලදී. එම වැඩසටහන් 3කට දයකත්වය සපයන ලද්දේ ජෛව සංඛ්‍යාන අධ්‍යයන මණ්ඩලයයි. ආයතනයට අනුයුක්ත කාර්ය මණ්ඩලය සඳහා එක් දින පුහුණු වැඩ සටහනක් කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ දී පවත්වන ලදී. ඊට අමතරව බාහිර පුහුණු ආයතන මගින් පවත්වන ලද විවිධ පුහුණු වැඩසටහන් සඳහා බොහොමයක් කාර්ය මණ්ඩල සාමාජිකයෝ තම දැනුම වර්ධනය කර ගැනීමේ අරමුණින් ඒවාට සහභාගි වූහ.

සමාලෝචිත වර්ෂයේදී ආයතනය විසින් මෙහෙය වන ලද පුහුණු වැඩසටහන්/වැඩමුළු/කෙටි කාලීන පාඨමාලා ආදිය පිළිබඳ තොරතුරු පහත වගුවෙන් විස්තර වේ.

| සංවිධායක (ආයතනය/ පීඨය/ දෙපාර්තමේන්තුව/ඒකකය/ කේන්ද්‍රය) | වර්ගය (සමුළු/ වැඩමුළු/ පුහුණු වැඩසටහන්/දැනුවත් කිරීමේ වැඩසටහන්/ කෙටි කාලීන පාඨමාලා /ක්ෂේත්‍ර ප්‍රදර්ශන/මාධ්‍ය වැඩසටහන් | වැඩසටහනෙහි මාතෘකාව | පැවැත් වූ දිනය/කාලය | සහභාගී වූ සංඛ්‍යාව | ඉලක්ක කළ කාණ්ඩය (උදා: බිම්මල් වගා ගොවියන්, පාසල් ළමුන්, ගුරුවරු) |
|---|---|---|---|---|---|
| කෘ.ප.උ.ආ | පුහුණු වැඩසටහන | ආයතනයෙන් බැහැරව පැවැත් වූ පුහුණු වැඩසහන් | පෙබ. 20 - 22 | 60 | කෘ.ප.උ.ආයතනයේ පශ්චාත් උපාධි සිසුන් |
| | කෙටි කාලීන පාඨමාලාව | බහු විචලතා දත්ත විශ්ලේෂණය | මාර්තු. 23-25 | 59 | රජයේ හා පුද්ගලික අංශයේ නිළධාරීන් |
| | කෙටි කාලීන පාඨමාලාව | PCR පදනම් වූ ඩී. එන්.ඒ. ඇඟිලි සලකුණු දත්ත විශ්ලේෂණය | මැයි. 08 | 20 | |
| | කෙටි කාලීන පාඨමාලාව | නියැදි තාක්ෂනික සැලසුම් හා අත්හදා බැලීම් විශලේෂණය | සැප්. 21-23 | 50 | කෘ.ප.උ.ආයතනයේ පශ්චාත් උපාධි සිසුන් හා රජයේ හා පුද්ගලික අංශයේ නිළධාරීන් |
| | වැඩමුළුව | ජල වෘත්තීමය දිනය | ඔක්. 01 | 40 | පර්යේෂකයන්, වෘත්තිකයන්, සහ ජලය හා සම්බන්ධ ක්ෂේත්‍රවල සිසුන් |
| | කෙටි කාලීන පාඨමාලාව | සංකලික ජල සම්පත් කළමනාකරණය | නොවැ. 09 - 12 | 28 | ඉංජිනේරුවන්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ජලය හා සම්බන්ධ අංශයන්හි වෘත්තිකයන් |
| | කෙටි කාලීන පාඨමාලාව | R- මෘදුකාංග | නොවැ.11-13 | | කෘ.ප.උ.ආයතනයේ පශ්චාත් උපාධි සිසුන් හා රජයේ හා පුද්ගලික අංශයේ නිළධාරීන් |
| | කෙටි කාලීන පාඨමාලාව | නායකත්ව හා වෘත්තීමය දක්ෂතාව සඳහා සන්නිවේදනය | නොවැ. 21-22 | 53 | කෘ.ප.උ.ආයතනයේ පශ්චාත් උපාධි සිසුන් |
| | වැඩමුළුව | සේවාස්ථ අවංකභාවය ගොඩනැගීම | දෙසැ. 03 | 34 | කෘ.ප.උ.ආයතනයේ කාර්ය මණ්ඩලය |
| | ක්ෂේත්‍ර ප්‍රදර්ශන | කිසිවක් නැත | - | - | - |
| | ප්‍රදර්ශන හා පොදු කටයුතු සංවිධානය කිරීම් | කිසිවක් නැත | - | - | - |
| | ගුවන් විදුලි /රූපවාහිනී/වෙනත් මාධ්‍ය වැඩසටහන්වලට සහභාගීවීම් | කිසිවක් නැත | - | - | - |
| | වෙනත් | කිසිවක් නැත | - | - | - |

### වාර්ෂික සමුළුව - 2015

මීට ප්‍රථම කරගෙන ගිය පරිද්දෙන්ම සමාලෝචිත වර්ෂයේ දී ද ආයතනයේ වාර්ෂික සමුළුව 2015 නොවැම්බර් මස 19 හා 20 යන දිනවල ශාක ජාන සම්පත් මධ්‍යස්ථානයේ දී (ගන්නෝරුව) පවත්වන්නට යෙදුනේ ශ්‍රී ලංකාවේ නෙදර්ලන්ත තානාපති ජෝන් ඩූනවර්ඩ් මැතිණියගේ අනුග්‍රහය යටතේය.




මහාචාර්ය එස් විමලසිරි සමුළු සමායෝජක ලෙස කටයුතු කළාය. ස්වීඩනයේ උප්සලා විශ්වවිද්‍යාලයේ භෞතික හා විශ්ලේශන රසායනවිද්‍යා දෙපාර්තමේන්තුව සහ ජෛව වෛද්‍ය මධ්‍යස්ථානයේ වෛද්‍ය එන් බර්ග්ක්විස්ට්, ඇමරිකා එක්සත් ජනපදයේ කැලිෆෝනියා විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර ඉගැන්වීම් මධ්‍යස්ථානයෙහි අධ්‍යක්ෂක ආචාර්ය මාක් බෙල් සහ ඇමරිකා එක්සත් ජනපදයේ ආගොනේ ජාතික පුස්තකාලයෙහි පාරිසරිකවිද්‍යා අංශයෙහි හූ අවකාශ පිළිබඳ විද්‍යාඥ ආචාර්ය උමාකන් මිශ්රා යන විද්වතුන් විසින් ආරාධිත දේශන ඉදිරිපත් කරමින් සමුළුව ඔපවත් කරන ලදහ. කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ගෞරවනීය විද්‍යාර්ථියෙක් වන UNDP සහකාර දේශීය අධ්‍යක්ෂිකා ආචාර්ය විශාකා හිදෙල්ලගේ සමුළු සමාප්ති උත්සවය අමතා සිය දේශනය ඉදිරිපත් කළාය.

**ජෝකීම් අනුස්මරණ සම්මානය**

සමාලෝචිත වසරෙහි උපාධි ලැබූ 321ක් දෙනෙකු අතුරින් පාංශුවිද්‍යා අධ්‍යයන මණ්ඩලය යටතේ පී.ජී සින්තියා මිය සහ කෘෂි ආර්ථිකවිද්‍යා අධ්‍යයන මණ්ඩලය යටතේ කේ.ඩී. ද සිල්වා මහත්මිය යන දෙදෙනා ඉහළම ජී.පී.ඒ අගයන් ලබා ගනිමින් ජෝකීම් අනුස්මරණ සම්මානයට හිමිකම් ලැබූහ.

කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විද්‍යාර්ථීන්ගේ සංගමය විසින් සමුළුවේදී විශිෂ්ඨ ඉදිරිපත් කිරීම් අගයනු පිණිස පහත දැක්වෙන සිසුන් හට මුදල් පරිත්‍යාග පිරිනමන ලදී

1. N M N නම්බපාන මිය, සත්ත්ව විද්‍යා අධ්‍යයන මණ්ඩලය
2. J A S චතුරිකා මිය, පාංශුවිද්‍යා අධ්‍යයන මණ්ඩලය
3. A R ගුණවර්ධන මහතා, කෘෂි ඉංජිනේරු අධ්‍යයන මණ්ඩලය

**සමුළුවේදී විශිෂ්ඨතම ඉදිරිපත්කිරීම් කරනු ලැබූවන් - 2015**

සමාලෝචිත වසරෙහි ආයතනයෙහි සිසුන් 38 දෙනෙක් තම පර්යේෂණ අනාවරණ සමුළු කාර්ය වාර්තාවල ප්‍රකාශයට පත් කළහ. එය පර්යේෂණ සිසුන් හට අනිවාර්ය ක්‍රියාකාරකමකි. සමුළුවට ඉදිරිපත් කරන ලද පත්‍රිකා ඇතුලත් කරමින් ග්‍රන්ථ පරිච්ඡේද 4ක් විද්‍යුත් මාධ්‍යයෙන් ප්‍රකාශයට පත් කරන ලදී. පශ්චාත් උපාධි සිසුන් විසින් ඉදිරිපත් කරන ලද පර්යේෂණ පත්‍රිකා 5ට අමතරව ඒවායෙහි උද්‍ධෘත පේරාදෙණිය විශ්වවිද්‍යාල පර්යේෂණ සැසි (2015) වාර්තාවල ප්‍රකාශයට පත් විය.

මෙම වසරේ දී ද පහත දැක්වෙන සිසුන් සමුළුව - 2015ට විශිෂ්ඨ ඉදිරිපත් කිරීම් කරනු ලැබූවන් ලෙස විනිශ්චය කෙරිණි.

**විශිෂ්ඨ ඉදිරිපත් කිරීම් (සමුළුව - 2015)**

| සම්මානය<br>(නාමය හා එහි අරමුණ) | ප්‍රාදේශීය/<br>දේශීය/<br>විදේශීය | ප්‍රදානලාභියාගේ නම/නම් | තරාතිරම | පීඨය/<br>දෙපාර්තමේන්තුව/<br>ආයතනය |
|---|---|---|---|---|
| සැසිය 1<br>කෘෂි ඉංජිනේරු සහ ජල සම්පත් කළමනාකරණය | දේශීය | AR ගුණවර්ධන මයා | ශිෂ්‍ය | කෘ.ප.උ.ආ |
| සැසිය 2<br>සත්ත්ව විද්‍යා | දේශීය | NMN නම්බපාන මිය | ශිෂ්‍ය | කෘ.ප.උ.ආ |
| සැසිය 3<br>ජෛව තාක්ෂණය | දේශීය | NMC නයනකාන්ත මයා | ශිෂ්‍ය | කෘ.ප.උ.ආ |
| සැසිය 4<br>ශෂ්‍ය නිෂ්පාදන | දේශීය | WMRSK වර්ණසූරිය මිය | ශිෂ්‍ය | කෘ.ප.උ.ආ |
| සැසිය 5<br>කීට විද්‍යා | දේශීය | TDC ප්‍රියදර්ශනී මිය | ශිෂ්‍ය | කෘ.ප.උ.ආ |
| සැසිය 6<br>පාංශු විද්‍යා | දේශීය | JAS චතුරිකා මිය | ශිෂ්‍ය | කෘ.ප.උ.ආ |
| සැසිය 7<br>ආහාර විද්‍යා | දේශීය | MPMSH පෙරේරා | ශිෂ්‍ය | කෘ.ප.උ.ආ |
| සැසිය 8<br>පෝස්ටර් ඉදිරිපත් කිරීම් | දේශීය | K. වෙරෝනිකා මිය | ශිෂ්‍ය | කෘ.ප.උ.ආ |
| සමස්තයක් ලෙස විශිෂ්ඨතම පත්‍රිකාව | දේශීය | NMN නම්බපාන මිය | ශිෂ්‍ය | කෘ.ප.උ.ආ |

## සමුළුවේදී විශිෂ්ඨතම ඉදිරිපත්කිරීම් කරනු ලැබූවන් - 2015



AR ගුණවර්ධන මයා



JAS චතුරිකා මිය


K. වෙරෝනිකා මිය



MPMSH පෙරේරා


NMC නයනකාන්ත මයා



NMN නම්බපාන මිය



TDC ප්‍රියදර්ශනි මිය



WMRSK වර්ණසූරිය මිය

ඇ. 5 ලබාගත් ජාතික හා ජාත්‍යන්තර සම්මාන - 2015

ඉහත නම් සඳහන් සිසුවා 2015 සමුළුවේ තෝරා ගනු ලැබූ තේමාව යටතේ විශිෂ්ඨ තම ඉදිරිපත් කිරීම වෙනුවෙන් හිමි සම්මානයට උරුමකම් කීය. ඇමරිකා එක්සත් ජනපදය, ස්වීඩනය, ස්පාඤ්ඤය, සහ නෙදර්ලන්තයෙන් ජාත්‍යන්තර පර්යේෂකයන් 09 දෙනෙක් ද ඊට සහභාගි වූහ.

ඇ. 6 ලැබුණු ශිෂ්‍යත්ව, අධිශිෂ්‍යත්ව සහ පුහුණු වැඩසටහන් (දේශීය හා විදේශීය ˚ 2015 දෙසැ 31 දිනට) කිසිවක් නැත

| ප්‍රදානලාභියාගේ නම | දෙපාර්තමේන්තුව | තනතුර | වැඩසටහන් වර්ගය (දර්ශනශූරි/ දර්ශනපති/විද්‍යාපති /ප.උ.ඩිප්ලෝමා/කෙටි කාලීන පුහුණු වැඩසටහන් | කාල සීමාව | සාමාජික සංඛ්‍යාව | රට |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

ඉ. ජාත්‍යන්තර කටයුතු

ඉ. 1 ආයතනය විසින් පවත්වන ලද ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සහ වැඩමුළු - 2015

| අංකය | තේමාව | සංවිධානය කරන ලද්දේ (පීඨය/කේන්ද්‍රය/ දෙපාර්තමේන්තුව/ ඒකකය) | පැවැත් වූ දිනය/කාල සීමාව | ඉලක්ක කාණ්ඩය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1 | IDRC-SAWA අධි ශිෂ්‍යත්ව පුහුණු වැඩසටහන | කෘෂි ඉංජිනේරු අධ්‍යයන මණ්ඩලය | නොවැ. 28 දින සිට දෙසැ. 03 දක්වා | ජලය මූලික කරගත් ක්ෂේත්‍රවල වෘත්තිකයන් | 50 |

ඉ. 2 එළඹෙන ලද ජාත්‍යාන්තර එකඟතා සහ අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම් 2015

| අංකය | වැඩසටහන/තේමාව | අවබෝධතා ගිවිසුම අත්සන් කළේද යන බව (ඔව්/නැත) | සම්බන්ධ වූ පීඨය/ දෙපාර්තමේන්තුව | සහයෝගීතා පාර්ශවය | අත්සන් කළ දිනය |
|---|---|---|---|---|---|
| 01 | ජෛව සංඛ්‍යානය විද්‍යාපති/ පශ්චාත් උපාධි ඩිප්ලොමා පිරිනැමීම | ඔව් | ජෛව සංඛ්‍යානය අධ්‍යයන මණ්ඩලය | යේසුඅා තාක්ෂණික ආයතනය | |

ඉ. 3 2015 වසරේදී උපාධි/පශ්චාත් උපාධි ඉගැන්වීම් කටයුතු /සම්මන්ත්‍රණ/ වැඩමුළු ආදියට ආයතනයට පැමිණි විදේශීය විද්වතුන් පිළබඳ තොරතුරු

| ආයතනය | වැඩසටහනෙහි නම | රට | සංඛ්‍යාව |
|---|---|---|---|
| කෘ.ප.උ.ආ | වාර්ෂික සමුළුව | ස්පාඤ්ඤය | 5 |
| | | ස්වීඩනය | 1 |
| | | නෙදර්ලන්තය | 1 |
| | | ඇමරිකා එක්සත් ජනපදය | 2 |

ඊ 2015 වසරේ දී ආරම්භ කරන ලද නව පාඨමාලා

| දෙපාර්තමේන්තුව | පාඨමාලාව | පාඨමාලා කේතය | මාධ්‍යය | උපාධි පාඨමාලා | සහතික පත්‍ර පාඨමාලා | ඩිප්ලෝමා පාඨමාලා | පශ්චාත් උපාධි පාඨමාලා | විද්‍යාපති | දර්ශනපති | දර්ශනශූරි | වෙනත් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ඉංග්‍රීසි | | | | | 02 | | | |

1. උද්‍යාන විද්‍යාව පිළිබඳ උසස් උපාධි
2. ශස්‍ය වැවිලි කළමනාකරණය පිළිබඳ උසස් උපාධි

තවද සිසුන්ගේ වර්තමාන ඉල්ලුමට සරිලනසේ රටෙහි අවශ්‍යතාව ද සැලකිල්ලට ගෙන පාඨමාලා අන්තර්ගතයෙහි තත්ත්වය උසස් කරමින් කෘෂි ජීවවිද්‍යා අධ්‍යයන මණ්ඩලය එහි කෘෂි ජීවවිද්‍යා උසස් උපාධි වැඩසටහන, ශාඛ ජීවවිද්‍යා සංරක්ෂණය සහ අභිජනනය පිළිබඳ විද්‍යාපති උපාධිය ලෙස ප්‍රති නාමගත කරන ලදී. මෙම පාඨමාලාවට 2016 දී සිසුන් ඇතුලත් කෙරේ.

## කෘෂිකර්ම විද්‍යා පුස්තකාලය

වගු අංක 01 ඃ 2015 වර්ෂයේ දී පුස්තකාලය සඳහා ලැබුණු ප්‍රතිපාදන

| | |
|---|---|
| කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් වෙන් කරන ලද ප්‍රතිපාදන | Rs.750,000.00 |
| කෘෂිකර්ම විද්‍යා පීඨය විසින් වෙන් කරන ලද ප්‍රතිපාදන | Rs.675,767.21 |
| එකතුව | **Rs.1425,767.21** |

අත්සන් කර ගැනීම - පොත්

කෘෂිකර්ම විද්‍යා පීඨයේ සහ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ආචාර්ය මණ්ඩලය එකී ආයතන දෙක විසින් සිදු කරන ලබන ඉගැන්වීම් කටයුතු වලට වඩාත්ම ගැලපෙන පරිදි නිර්දේශ කරන ලද පාඨ ග්‍රන්ථ ද ඇතුලත්ව පොත් 342 ක් 2015 වර්ෂයේදී පුස්තකාලයේ පොත් සංචිතයට එකතු විය.

වගු අංක 02 ඃ පුස්තකාල පොත් සංචිතයට එකතු වු පොත් පිළිබඳ විස්තර

| විස්තරය | සංඛ්‍යාව | වටිනාකම |
|---|---|---|
| කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අරමුදල් වලින් මිලදී ගන්නා ලද පොත් | 40 | 449,153.36 |
| කෘෂිකර්ම විද්‍යා පීඨයෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් මිලදී ගන්නා ලද පොත් | 49 | 712,127.69 |
| කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය හා කෘෂිකර්ම විද්‍යා පීඨය යන ආයතන දෙකෙන්ම මිලදී ගත් මුළු පොත් සංඛ්‍යාව | 89 | |
| සංචිතයට එකතු වු කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පශ්චාත් උපාධි පර්යේෂණ නිබන්ධන | 21 | |

වගු අංක 03 ඃ පරිත්‍යාග

| විස්තරය | සංඛ්‍යාව | වටිනාකම |
|---|---|---|
| වෙනත් පරිත්‍යාගශීලීන්ගේ ලද පොත් සංඛ්‍යාව | 232 | 328,656.78 |
| සංචිතයට එකතු වු මුළු පොත් සංඛ්‍යාව ( මිලදී ගැනීම් + පරිත්‍යාග ) | 342 | |

වගු අංක 04 ඃ වාර සඟරා

| විස්තරය | සංඛ්‍යාව | වටිනාකම |
|---|---|---|
| කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අරමුදල් වලින් මිලදී ගන්නා ලද වාර සඟරා | 05 | 29,358.49 |
| කෘෂිකර්ම විද්‍යා පීඨ ප්‍රතිපාදන වලින් ඇනවුම් කරන ලද වාර සඟරා සංඛ්‍යාව | 00 | 00 |
| ඇනවුම් කරන ලද මුළු වාර සඟරා සංඛ්‍යාව (කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සහ කෘෂිකර්ම විද්‍යා පීඨය ) | **05** | **29,358.49** |

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අරමුදල් වලින් විදේශීය වාර සඟරා ද ඇතුලත්ව වාර සඟරා 5ක් සඳහා දායකත්වය දරා ඇත.

වගු අංක 05 ඃ පුස්තකාලය පරිහරණය කරනු ලබන පුද්ගලයින් සංඛ්‍යාව

| වර්ගය | සංඛ්‍යාව |
|---|---|
| පශ්චාත් උපාධි අපේක්ෂක සිසුන් | 1266 |
| උපාධි අපේක්ෂක සිසුන් | 1239 |
| අධ්‍යයන කාර්යය මණ්ඩලය(ස්ථිර) | 159 |
| අධ්‍යයන කාර්යය මණ්ඩලය (තාවකාලික) | 04 |
| අධ්‍යයන සහායක කාර්යය මණ්ඩලය(ස්ථිර) | 01 |
| එකතුව | **2669** |

**පුස්තකාලයේ පොත් භාවිතය**

2015 වර්ෂය තුලදී ආචාර්ය මණ්ඩලය හා සිසුන් අතර සංසරණය වු මුළු පොත් සංඛ්‍යාව 3056 කි.

**පුස්තකාල අතර ණය පදනම මත පොත්පත් හුවමාරු කර ගැනීම ඃ**

ශ්‍රී ලංකාවේ වෙනත් පුස්තකාල වලින් පොත් ලබා ගැනීම සඳහා ඉල්ලීම් 04 ක් ලැබී තිබුණි.මෙම ඉල්ලීම් 04 න් 03 ක් සපයන ලදී.

**කෘෂිකර්ම තොරතුරු ජාලය - AGRINET (Agriculture Information Network)**

AGRINET Content Page සේවාව යටතේ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ආයතන වල සේවය කරනු ලබන පර්යේෂකයින්ගේ හා විද්‍යාඥයින්ගේ ප්‍රයෝජනය සඳහා Journal Content Pages කෘෂිකර්ම පුස්තකාල අතර බෙදා හරින ලදී.මෙම වැඩ සටහන යටතේ කෘෂිකර්ම පුස්තකාලය විද්‍යාඥයින් හට Journal Content Pages 22 ක් සපයා ඇත.

**Literature Searching**

CAB CD- ROM database was used for literature searching by research students both in the Faculty and PGIA. Fifty nine (59) CAB searches were carried out during the Year 2015.

**Tropical Agricultural Research ග්‍රන්ථය විකිණීම හා හුවමාරු කර ගැනීම.**

මෙම ග්‍රන්ථය අලෙවි කිරීමේ කටයුතු කෘෂිකර්ම පුස්තකාලය විසින් සිදු කරනු ලැබේ.

| | | |
|---|---|---|
| 2015 වසරේදී අලෙවි කරන ලද පිටපත් සංඛ්‍යාව(සම්පූර්ණ වෙළුම) | - | 13 |
| අනෙකුත් ආයතන සමඟ හුවමාරු කර ගන්නා ලද පිටපත් සංඛ්‍යාව (ප්‍රකාශයට පත් කිරීම සඳහා) | - | 00 |

**<u>කෘෂිකර්ම පුස්තකාලයේ වෙනත් සහයෝගීතා ක්‍රියාකාරකම්ඃ</u>**

කේපිකේ දඹවින්න මිය, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛාධිකාරිනී/ කෘෂිකර්ම විද්‍යා පුස්තකාලය 2015.08.03 දින සිට සප්තවාර්ෂික නිවාඩු ලබා ගත්තාය

ඕකේ අබේරත්න මිය, සහකාර ලේඛාධිකාරිනී වශයෙන් 2015.08.03 දින සිට කෘෂිකර්ම විද්‍යා පුස්තකාලයේ සේවය ආරම්භ කලාය.

රනිල් අවන්ත බණ්ඩාර මහතා (පුස්තකාල කම්කරු) 2015.06.15 දින සිට පුස්තකාල සහායක වශයෙන් සේවා උසස්වීමක් ලබා ප්‍රධාන පුස්තකාලයට අනුයුක්ත කරන ලදී.

කෘෂිකර්ම පුස්තකාලයේ සියළුම කාර්ය මණ්ඩලය හා කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කාර්ය මණ්ඩලය 2015.12.03 දින නිපුණතා සංවර්ධන අරමුදල සංවිධානය කළ "සේවා ස්ථානයේ අභිවෘද්ධිය" පිළිබඳ වැඩමුළුවකට සහභාගීවූහ.

## <u>මූල්‍ය කාර්යසාධනය</u>

### පුනරාවර්තන වියදම් විස්තර

| විෂය | 2013 (රු.) | | 2015 (රු.) | | 2015 (රු.) | |
|---|---|---|---|---|---|---|
| | වෙන්කිරීම් | සත්‍ය | වෙන්කිරීම් | සත්‍ය | වෙන්කිරීම් | සත්‍ය |
| (අ) පුද්ගලික පඩිනඩි | **41,203,000** | 39,907,916 | **50,445,000** | 42,291,801 | **58,924,000** | 57,714,664 |
| (ආ) ප්‍රවාහන | **100,000** | 90,183 | **900,000** | 92,045 | **100,000** | 75,692 |
| (ඇ) සැපයීම් | **3,625,000** | 3,303,068 | **3,990,000** | 3,691,345 | **4,560,000** | 2,519,653 |
| (ඈ) නඩත්තු | **985,000** | 1,239,819 | **1,400,000** | 1,019,196 | **1,010,000** | 1,083,394 |
| (ඉ) කොන්ත්‍රාත් සේවා | **5,635,000** | 5,448,947 | **8,840,000** | 6,756,642 | **9,260,000** | 8,322,628 |
| (ඊ) වෙනත් | **18,290,000** | 20,036,458 | **22,480,000** | 36,257,738 | **16,610,000** | 28,170,302 |
| එකතුව | **69,838,000** | 78,026,391 | **88,055,000** | 90,108,767 | **90,464,000** | 97,886,332 |
| <u>මූල්‍ය සැපයුම්</u> | | | | | | |
| රජයේ ප්‍රදාන මගින් | **19,000,000** | | **16,080,000** | | **19,000,000** | |
| % | **27%** | | **18%** | | **21%** | |
| උත්පාදන මුදල් | **50,838,000** | | **71,975,000** | | **71,464,000** | |
| % | **73%** | | **82%** | | **79%** | |




2015 වසර සඳහා ආයතනයේ පුනරාවර්තන වියදම් වෙනුවෙන් රු මිලියන 19.0ක් ද ප්‍රාග්ධන වියදම් සඳහා රු මිලියන 10.0ක් ද වෙන් කර තිබිණ. පසුගිය වසර හා සසඳන විට එය පිළිවෙලින් රු මිලියන 03ක් පමණ හා රු මිලියන 01ක් පමණ වැඩිවීමකි. මෙම වසර සඳහා පුනරාවර්තන හා ප්‍රාග්ධන සත්‍ය වියදම පිළිවෙලින් රු මිලියන 97.87ක් හා රු මිලියන 8.22ක් විය. මූලික වශයෙන් මුලු පුනරාවර්තන වියදමෙන් 79%ක් උත්පාදනය කළ අරමුදල්වලින්ද ඉතිරි 21% සමුච්චිත අරමුදලෙන්ද සැපයිණි. පුනරාවර්තන වියදමෙන් 58.96%ක් පමණ ස්ථිර කාර්ය මණ්ඩලයේ වැටුප් හා වේතනද බාහිර දේශන ගාස්තු සඳහාද වැය විය. මුලු පුනරාවර්තන වියදමෙන් 28.78%ක් වෙනත් පුනරාවර්තන වියදම් ලෙස සැලකෙන දේශන සටහන්, විශේෂ සේවා, විශ්වවිද්‍යාල ආචාර්ය මණ්ඩලය සඳහා ගෙවූ ගමන් ගාස්තු, වාර්ෂික සමුළුව ආදිය සඳහා වැය විය. පහත දැක්වෙන වගුවෙහි පුනරාවර්තන වියදම් සංයුතිය දක්වා ඇත.

ප්‍රාග්ධන වියදම් විස්තර

| විෂය | 2013 (රු) | | 2015 (රු) | | 2015 (රු) | |
|---|---|---|---|---|---|---|
| | වෙන්කිරීම් | සත්‍ය | වෙන්කිරීම් | සත්‍ය | වෙන්කිරීම් | සත්‍ය |
| (අ) ලී භාණ්ඩ හා කාර්යාලීය උපකරණ ලබා ගැනීම | **2,500,000** | 3,976,203 | **6,050,000** | 7,623,417 | **6,732,000** | 4,587,026 |
| (ආ) රසායනාගාර හා ඉගැන්වීම් උපකරණ ලබා ගැනීම | **-** | - | **1,600,000** | 1,340,392 | **-** | - |
| (ඇ) ගොඩනැගිලි හා ව්‍යුහ ප්‍රතිසංස්කරණ හා වැඩි දියුණුව | **6,706,000** | 8,430,449 | - | 4,929,799 | **7,060,000** | 2,516,299 |
| (ඇ) රථවාහන | **-** | - | **350,000** | 389,831 | **-** | 89,664 |
| (ඉ) වෙනත් -පුස්තකාල පොත් හා වාර සඟරා | - | 996,409 | **500,000** | 1,058,161 | **750,000** | 1,031,458 |
| (ඊ) ක්‍රීඩා උපකරණ | | | **500,000** | - | **-** | - |
| (උ) දුරකථන පද්ධති | | | - | 426,328 | - | - |
| එකතුව | **9,206,000** | **13,403,062** | **9,000,000** | **15,767,929** | **14,542,000** | **8,224,447** |




ප්‍රාග්ධන ආයෝජනවලින් 30.6%ක් පමණ එනම් රු මිලියන 2.51ක් ආයතනයේ ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය සඳහා වැය විය. ප්‍රාග්ධන වැයෙන් 55.75%ක් එනම් රු මිලියන 4.58ක් පමණ පංති කාමර හා පරිගණක රසායනාගාරවල පහසුකම් ඉහළ නැංවීම සඳහා වැය කරන ලදී. තවද රු මිලියන 1.09ක් කෘෂිවිද්‍යා පුස්තකාලයේ පොත්පත් හා වාර සඟරා ලබා ගැනීම සඳහා වියදම් විය. ප්‍රාග්ධන වියදම් සංයුතිය ඉහත දැක්වෙන රූප සටහනෙන් පිළිබිඹු වේ.

**පේරාදෙණිය විශ්ව විද්‍යාලයට අනුබද්ධිතව ක්‍රියාත්මක වන කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2015 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ මුදල් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීමේදී අනුගමනය කරන ලද ව්‍යවස්ථායික වාර්තාකරණ හා වැදගත් ගිණුම් ප්‍රතිපත්ති**

1) **සාමාන්‍යය**

2015 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ මුදල් වර්ෂය සඳහා වූ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය ප්‍රකාශනය 1979 අංක 09 දරණ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතන ආඥා පනතේ 12(3)(ඉ) සහ 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතේ අංක 106(1) සහ 107(ආ) වගන්තිය සහ ඉන්පසුව නීති ප්‍රකාරව කරන ලද සංශෝධන හා 1971 අංක 38 දරණ මුදල් පනත ප්‍රකාරව සකස් කොට ඇත.

2) **අනුගමනය කරන ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**2.1 ගිණුම්කරණයට මුල් වූ පදනම.**

අදාළ වර්ෂය සඳහා ආයතනයේ මුදල් ප්‍රකාශනය පිළිවෙලින් 2009 සහ 2012 වර්ෂයන්හි දී ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් 1 වන වෙළුම හා 11 වන වෙළුම ප්‍රකාරව ද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ප්‍රකාශිත ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලවද පිළියෙල කොට ඇත.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන, 1995 අංක 15 දරණ පනත මගින් ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිතීන් පිළිබඳ පනතේ විධිවිධානවලට යටත්ව භාවිතා කරන ලද ගිණුම්කරණ සම්මතයන්ට අනුකූලව ඓතිහාසික පිරිවැය සම්මතයන්ට (Historical Cost Convention) අනුව පිළියෙල කොට ඇත.

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මෙම වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශය සකස් කිරීමේ දී පසුගිය වර්ෂයේ අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිම අනුගමනය කොට ඇත. අවශ්‍ය තැන් වලදී ,විමර්ෂණයට භාජනය කරනු ලබන වර්ෂයට අනුකූල වන පරිදි සංසන්දනාත්මක අගයන් ගැලපුම් කොට ඇත. නමුත් ගිණුම් වලට බලපාන්නා වූ උද්ධමනාත්මක සාධක සඳහා ගැලපුම් සිදුකොට නොමැත.

පර්යේෂණ කටයුතු සඳහා බාහිර මූලාශ්‍රයන්ගෙන් ලැබෙන ප්‍රතිපාදන මුදල් පදනම මත ගිණුම් ගත කොට ඇත.

3) **දේපළ , යන්ත්‍රෝපකරණ හා උපකරණ**

3.1 දේපළ , යන්ත්‍රෝපකරණ හා උපකරණ එහි පිරිවැයට අනුව වාර්තා කොට ඇති අතර ක්ෂය වීම් 1995 ඔක්තෝබර් 05 අංක 649 දරන විශ්විද්‍යාල කොමිෂන් සභා චක්‍ර ලේඛය හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 ප්‍රකාරව ගණනය කොට ඇත. මූල්‍ය කාර්යය සාධන වාර්තාවටම මෙම ක්ෂය වීම් ඍජු පදනම මත ගණනය කොට ඇත.

එසේම විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවේ චක්‍රලේඛ විධිවිධාන පරිදි උපකරණ වල ක්‍ෂය වීම් සඳහා රේටයන් තීරණය කොට ඇත.

දේපළ , යන්ත්‍රෝපකරණ හා ආම්පන්න පිරිවැයේ අගය අනුව සඳහන් කොට ඇති අතර ක්ෂය වීම් විශ්විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභා චක්‍රලේඛ උපදෙස් අනුව ගණනය කොට ඇත.

| දේපළ යන්ත්‍රෝපකරණ හා <u>ආම්පන්න</u> | | ක්ෂය වීමේ අගය <u>(වර්ෂයකට ප්‍රතිශතයක් ලෙස)</u> |
|---|---|---|
| 1. ගොඩනැගිලි හා ව්‍යුහයන් | - | 05 |
| 2. කාර්යාලයීය උපකරණ | - | 20 |
| 3. නිවාස ව්‍යාපෘතිවලට අදාළ උපකරණ | - | 20 |
| 4. ගෘහ භාණ්ඩ හා මෙවලම් | - | 10 |
| 5. රසායනාගාර , ඉගැන්වීම් හා කාර්යාලයීය උපකරණ | - | 20 |
| 6. රථවාහන | - | 20 |
| 7. පුස්තකාල පොත් සහ වාර සඟරා | - | 20 |

යම් වත්කමක් භාවිතයට ගැනීමේ ආරම්භයක් සමඟම එය ක්ෂය වීමට පටන් ගන්නා අතර , එකී වත්කම විකිණීමට හෝ භාවිතයෙන් ඉවත් කිරීමට තීරණය කරනු ලබන දිනට පෙර දින එම ක්ෂය වීම් නවති.

තක්සේරු දෙපාර්තමේන්තුව විසින් රුපියල් 90,740,443.79 න් වටිනා ස්ථාවර වත්කම් නැවත තක්සේරු කිරීමේදී එම අගය 2015 ජනවාරි මාසයේ ක්ෂය වීම් ආරම්භ වීමක් සමඟම අගය බිංදුව බවට පත්ව තිබූ ස්ථාවර වත්කම් එයට අදාළ අවසාන වාර්තාව ලැබීමෙන් පසු නැවත තක්සේරු කරන ලද එකී අගය ගිණුම්ගත කරන ලදී.

රුපියල් 35,059,653.74 ක් වටිනා පුස්තකාල පොත් සහ වාර සඟරා භෞතිකමය වශයෙන් සත්‍යාපනය කිරීම උපකුලපති තුමා විසින් පත් කරන ලද කමිටුවක් විසින් සිදු කරන ලද අතර එකී කාර්යයට අදාළ මූලික වාර්තාව එකී කටයුත්ත සම්බන්ධීකරණය කරන ලද පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පුස්තකාලාධිපතිතුමිය විසින් 2014 අගෝස්තු මාසයේදී ඉදිරිපත් කරන ලදී. කළමණාකරණ මණ්ඩලය විසින් අනු කමිටුවක් පත් කරන ලදුව මෙම කාර්යය සම්පූර්ණ කිරීමට පියවර ගෙන තිබෙන අතර ඉදිරියේදී මූල්‍ය රෙගුලාසි වල සඳහන් කොට ඇති නියමිත කාර්යය පටිපාටි අනුගමනය කරමින් නැතිවූ පුස්තකාල පොත්පත් සම්බන්ධ අදාළ ගැළපුම් අදාළ මූල්‍ය ප්‍රකාශයේ සඳහන් කිරීමට පියවර ගනු ලැබේ.

3.2 කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය පේරාදෙණිය විශ්ව විද්‍යාලයට අනුබද්ධිත ආයතනයක් ලෙස පිහිටුවා ඇති බැවින් මෙම ආයතනය පිහිටි භූමියේ අයිතිය නීත්‍යානුකූලව පවරා ගෙන නොමැත. එබැවින් ආයතනයේ මූල්‍ය ප්‍රකාශය පිළියෙල කිරීමේ දී එකී ඉඩමේ වටිනාකම සැලකිල්ලට නොගෙන තිබේ.ගොඩනැගිලි වටිනාකම රු.103,656,05837 ලෙස මූල්‍යවාර්තාවල සඳහන්කර ඇත.

**4. ජංගම වත්කම්**

ආයතනයේ සාමාන්‍ය ක්‍රියාකාරී චක්‍රය තුළ හෝ වාර්තා කරනු ලබන දින සිට වර්ෂයක් ඇතුළත හෝ ඒ දෙකින් වඩා කෙටි කාලය තුළ යම් ආයතනයක ශේෂ පත්‍රයේ සඳහන් ජංගම වත්කම් , බැංකු ගිණුම් වල ඇති මුදල් සහ උප ලබ්ධි වීමට නියමිත චෙක්පත් යන සියල්ල ජංගම වත්කම් යනුවෙන් හැඳින්වේ.

**4.1 බඩු වට්ටෝරු පොත් සහ තොග**

බඩු වට්ටෝරු පොත් සහ තොගවල වටිනාකම නියම පිරිවැයට අනුකූලව තක්සේරු කරනු ලැබේ. ප්‍රථමයෙන්ම ලැබ ප්‍රථමයෙන්ම නිකුත් කිරීමේ (First- In, First – Out) පදනම මත පිරිවැය ගණනය කරනු ලැබේ. ගිණුම් වලද නිදහස් තොග ශේෂයන් තොග ගැනීමක් වශයෙන් සත්‍යාපනය කරන ලදී.

**4.2 වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු දෑ**

ඇස්තමේන්තු ගත උපලබ්ධි විය හැකි ප්‍රමාණයන්ගෙන් වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු දෑ මෙහි සඳහන් වන අතර අය කර ගැනීමට නොහැකි සහ සැක සහිත ණය සඳහා අවශ්‍ය පරිදි ප්‍රකාශන වල ප්‍රතිපාදන සකසා ඇත. අදාළ කාල පරිච්ඡේදය තුළ පාඨමාලා ගාස්තු වලින් උපයා ගත හැකි ආදායම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 29 ට අනුව හඳුනා ගෙන ඇත. ඒ අනුව පශ්චාත් උපාධි ඩිප්ලෝමා , විද්‍යාපති(Msc) , දර්ශනපති(M.phil) , ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති(M.BA) සහ දර්ශන ශූරි(Ph.D) යන පශ්චාත් උපාධි පාඨමාලාවලින් පිළිවෙලින් අවුරුදු 1 ,1 1/2, 2, 2 1/2 සහ 3 කාලයන් සඳහා ආදායම් ලැබෙන බවට හඳුනාගෙන ඇත. 2015 දෙසැම්බර් 31දිනට කාර්යය මණ්ඩලයෙන් අය වීමට තිබෙන තත්‍ය ණය ශේෂය ලැබිය යුතු ණය වශයෙන් සලකනු ලැබේ.

**4.3 මුදල් හා මුදල් සමාන දෑ (Cash and cash equivalence)**

බැංකු තැන්පතුවල තිබෙන මුදල් , කල් පිරෙන තුරු බැංකු ගතව ඇති කෙටි කාලීන තැන්පතු පිරිවැයට ගෙන එනු ලැබේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේ අරමුණ හා ගත් කළ මුදල් හා මුදල් හා සමාන දෑ යන්නට අතැති මුදල් , බැංකු තැන්පතු , හිඟ බැංකු අයිරා ඇතුළත් වේ.

## 5. වගකීම් හා ප්‍රතිපාදන

ශේෂ පත්‍රගත ජංගම වගකීම් ලෙස දක්වා ඇති වගකීම් වන්නේ කල් පිරීමෙන් පසු ඉල්ලූ විටක ගෙවන හෝ ශේෂපත්‍රය සකස් කරනු ලබන දින සිට වර්ෂයක් ඇතුළත ඉල්ලූ විටක ගෙවිය යුතු ගෙවීම්ය. එසේම, ශේෂ පත්‍රය සකස් කරනු ලබන දිනයේ සිට වර්ෂයකට පසුව ගෙවීමට නියමිතව තිබෙන ශේෂයෙන් ජංගම නොවන වගකීම් යනුවෙන් හඳුන්වනු ලැබේ. ආයතනයේ මූල්‍ය ප්‍රකාශය සකස් කිරීමේදී උපචිත සියලුම වගකීම් ගිණුම් ගත කොට ඇත.

### 5.1 සේවා නියුක්තිකයින්ට ගෙවනු ලබන ප්‍රතිලාභ

#### 5.1.1 නිත්‍ය දායකත්ව සැලසුම්

යම් පුද්ගලයෙකු සේවයෙන් විශ්‍රාම ගිය පසු ඔහු වෙනුවෙන් ආයතනය විසින් වෙන්ව ක්‍රියාකර ආයතනයක්ම ගෙවනු ලබන පසු රැකියා ප්‍රතිලාභ  නිශ්චිත දායකත්ව සැලසුමක් ලෙස හැඳින්වේ. මෙසේ ගෙවීම් කිරීමේ දී වැටුපෙන් ස්ථාවර අනුපාතයක් ගෙවනු මිස එය අභිබවා කිසිදු ගෙවීමක් කිරීමට නීතිමය බැඳීමක් නොමැත. සියලුම සේවා නියුක්තිකයින් ආවරණය වන පරිදි සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට ගෙවීම් සිදු කිරීමට ඇති බැඳීම් ලාභ ඉපයීමේ හෝ දරණ ලද පාඩු වල වියදමක් ලෙස ගැනේ.

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් සිය සේවානියුක්තිකයින් වෙනුවෙන් සේවක අර්ථ සාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට පිළිවෙලින් 15%ක් 3% ගෙවනු ලැබේ.

#### 5.1.2 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් යනු සේවා නියුක්තිකයින් විශ්‍රාම ගැනීමෙන් පසුව ඔවුනට ප්‍රතිලාභ ලබා දීමට අමතරව එයට අමතරව ප්‍රතිලාභ ලබාදෙන සැලස්මකි. සේවානියුක්තිකයින්ගේ ප්‍රතිලාභ පිළිබඳ  ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19ට අනුකූලව සියලුම සේවා නියුක්තකයින් සඳහා සේවයට ඇතුළත් වූ පළමු වසරේ සිටම විශ්‍රාම පාරිතෝෂිත ගෙවීමට අවශ්‍ය ප්‍රතිපාදන සලසා තිබේ. කෙසේ වුවද , 1983 අංක 12 දරන පාරිතෝෂිත ගෙවීම් පනතට අනුව යම් සේවා නියුක්තිකයෙකු හට එකී ගෙවීම් කිරීමට හැකියාව ඇත්තේ ඔහු හෝ ඇය වසර 05 ක අඛණ්ඩ සේවා කාලයක් සපුරා ඇත්නම් පමණි.

### 5.2 ප්‍රතිපාදන

අතීතයේ ඉටු කරන ලද කාර්යයක ප්‍රතිපලයක් ලෙස ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ නම් මෙම ප්‍රතිපාදන යථාවත් ලෙස ඉදිරිපත් කිරීමට අවශ්‍ය නීතිමය හා ගිවිසුම් ගත බැඳීම් කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් ඉදිරිපත් කොට ඇත. මෙම බැඳීම් සඳහා අදාළ ගෙවීම්  කිරීමට ආර්ථික ප්‍රතිලාභ ගලා යෑමක් අවශ්‍ය වන්නේය.

**බොල් සහ අඩමාන ණය සඳහා වන ප්‍රතිපාදන**

පාඨමාලා හා ලියාපදිංචි ගාස්තු වශයෙන් අය කර ගත යුතුව තිබූ එහෙත් අය කර ගැනීමට නොහැකි බොල් සහ අඩමාන ණය සඳහා ආයතනික මූල්‍ය ප්‍රකාශනයේ ප්‍රතිපාදන සලසා නොමැත. කෙසේ වුවද , ආයතනය සතු සමස්ථ දත්ත අනුව ආයතනයට පාලනය කළ නොහැකි හේතු සාධක මත පමණක් සෑම වර්ෂයකදීම පාඨමාලා හා ලියාපදිංචි ගාස්තු වලින් දළ වශයෙන් 10% ක් පමණ අය කර ගැනීමට නොහැකි වී ඇති හැර යන සිසුන් වෙනුවෙන් සෑම උපාධි වැඩසටහනක් සඳහාම අයවැය සකස් කිරීමේ දී අපේක්ෂිත පාඨමාලා ගාස්තු  හා ලියාපදිංචි ගාස්තු වලින් 10% ක ප්‍රමාණයක් අධ්‍යයන කටයුතු අතරමගදී හැර යන සිසුන් වෙනුවෙන් නොසලකා හැර ඇත.

එමනිසා 2015/12/31  දිනට ලැබිය යුතුව තිබෙන පාඨමාලා හා ලියාපදිංචි ගාස්තු වලින් 10% කට සමාන ප්‍රතිශතයක් මෙම වසරේ සිට අය කර ගැනීමට නොහැකි බොල් සහ අඩමාන ණය ප්‍රතිපාදන වශයෙන් ආයතනික මූල්‍ය ප්‍රකාශනයේ සඳහන් කොට ඇත. මෙම ප්‍රතිපාදන වෙන් කිරීම මෙම වසරේ සිට ආරම්භ කොට ඇති අතර සෑම වර්ෂයකදීම සත්‍ය ලෙසට අතරමගදී පාඨමාලා හැර යන ප්‍රතිශතය පදනම් කොටගෙන අදාළ ගැලපුම් සිදු කිරීමට නියමිතය.

**5.3 වෙළෙඳ හා ගෙවිය යුතු වෙනත් දෑ**

ගෙවීමට අපේක්ෂිත මුදල් හා මුදල් සමාන දෑ වගකීම් වශයෙන් ගිණුම් ගත කොට ඇත.

**7.0 අසම්භාව්‍ය වගකීම් හා වත්කම්**

**7.1 අසම්භාව්‍ය වගකීම්**

2015.12.31 දිනට කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය අසම්භාව්‍ය වගකීම් හඳුනා ගෙන නොතිබුණි.

**7.2 අසම්භාව්‍ය වත්කම්**

2015.12.31 දිනට කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය අසම්භාව්‍ය වත්කම් හඳුනා ගෙන නොතිබුණි.

**8.0 මූල්‍ය කාර්යය සාධනය පිළිබඳ ප්‍රකාශය**

8.1 **වර්තමාන අගය ගණනය කිරීමේ දී ,**

ආයතනයේ ව්‍යාපාරික කටයුතු කරගෙන යාමේදී හා මූලධන වත්කම් පවත්වාගෙන යාමේ දී දරන ලද සියලුම වියදම් ආදායමෙන් අඩු කරන ලදී.

8.2 ආයතනයේ ඉපැයීම් ධාරිතාව ඉහළ නැංවීම පිණිස සිය කටයුතු පවත්වාගෙන යෑමේ දී වත්කම් අත්පත් කර ගැනීම, වැඩි කර ගැනීම හා වැඩි දියුණු කිරීම සඳහා දරන ලද වියදම් මූලධන වියදම් ලෙස සලකන ලදී.

**9.0 බදුකරණය**

2006 අංක 01 දරන දේශීය ආදායම් පනතේ 7 (ආ) (v) වගන්තිය ප්‍රකාරව කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ආදායම් බදු ගෙවීමෙන් නිදහස් කොට ඇත.

**10.0 රජයේ ප්‍රතිපාදන**

ශ්‍රී ලංකා රජයේ මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රතිපාදන අදාළ පිරිවැය හඳුනා ගන්නා ලද කාල පරිච්ඡේදය තුළ දී ලද ආදායම ලෙස සැලකේ.

අදාළ කාල පරිච්ඡේදයට පසුව වත්කම් අත්පත් කර ගැනීම සඳහා වියදම් කරන ලද රජයේ ප්‍රතිපාදන විලම්භණය වූ ආදායම් ලෙස සලකනු ලැබේ. රජයේ ප්‍රතිපාදනවලට ඇතුළත් අනෙකුත් වත්කම් මුදල් හා මුදල් හා සමාන දෑ (ලැබුණු ප්‍රතිපාදන අනුව බැඳී ඇති වගකීම්) යනාදිය වගකීම් යනුවෙන් හඳුනා ගනු ලැබේ.

මහා භාණ්ඩාගාරයෙන් වෙන් කරන ලද , නිදහස් කරන ලද හා නිදහස් කිරීමට ඇති මූල්‍ය ප්‍රතිපාදන ශේෂ පිළිබඳ සාරාංශය පහත දැක්වේ.

| විස්තරය | වෙන් කරන ලද මුදල (රුපියල්) | නිදහස් කරන ලද ප්‍රතිපාදන (රුපියල්) | නිදහස් කිරීමට ඇති මුදල (රුපියල්) |
|---|---|---|---|
| පුනරාවර්තන ප්‍රතිපාදන | 19,000,000 | 19,000,000 | - |
| ප්‍රතිසංස්කරණ හා වැඩි දියුණු කිරීම්<br>1. ගොඩනැගිලි<br>2. වාහන<br>3. උපකරණ<br>4.වෙනත් | 6,0000,000 | 6,0000,000 | -<br>-<br>-<br>- |
| වත්කම් අත්පත් කර ගැනීම<br>1. පොත් හා වාර සඟරා<br>2.විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ<br>3. කාර්යාලයීය උපකරණ<br>4. ගෘහ භාණ්ඩ හා සවි කිරීම්<br>5. ක්‍රීඩා භාණ්ඩ | 750,000<br>-<br>3,250,000<br>-<br>- | 750,000<br>-<br>3,250,000<br>-<br>- | -<br>-<br>-<br>-<br>- |
| එකතුව | 29,000,000 | 29,000,000 | - |

# කෘෂිකර්මවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
# පේරාදෙණිය විශ්වවිද්‍යාලය
## 2015 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| | සටහන් | 2015.12.31 | | 2014.12.31 | |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | රු. | රු. | රු. | රු. |
| **ජංගම වත්කම්** | | | | | |
| (අ) මුදල්, මුදල් හා සමාන දෑ | 01 | 1,954,332 | | 4,729,978 | |
| (ආ) වෙළඳ හා අනෙකුත් ලැබියයුතු දෑ | 02 | 44,117,214 | | 36,913,091 | |
| (ඇ) තොගය | 03a | 1,088,729 | | 1,242,049 | |
| (ඈ) නිර්දේශිත ග්‍රන්ථ හා ප්‍රකාශන | 03b | 1,454,279 | | 1,510,019 | |
| (ඉ) පූර්ව ගෙවීම් / වාර සගරා | 04 | 112,251 | | 413,547 | |
| (ඊ) ණය සහ අත්තිකාරම් | 05.1 | 3,381,240 | | 925,640 | |
| (උ) අනෙකුත් මූල්‍ය වත්කම් | | 157,800 | **52,265,845** | 157,800 | **45,892,123** |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| (අ) සේවක ණය සහ අත්තිකාරම් | 05.1 | 3,523,097 | | 4,628,198 | |
| (ආ) දිගු කාලීන ආයෝජන | 06 | 300,449,966 | | 250,378,997 | |
| (ඇ) දේපල පිරියත හා උපකරණ | 07 | 123,254,353 | **427,227,416** | 64,629,771 | **319,636,966** |
| **මුළු වත්කම්** | | | 479,493,261 | | 365,529,089 |
| **වගකීම්** | | | | | |
| **ජංගම වගකීම්** | | | | | |
| (අ) විලම්බිත ආදායම් | 08.1 | 24,612,500 | | 21,864,499 | |
| (ආ) ගෙවිය යුතු වියදම් | 09 | 16,836,679 | | 17,423,751 | |
| (ඇ) උපචිත වියදම්/ වෙන්කිරීම් | 10 | 11,636,738 | **53,085,917** | 28,704,032 | **67,992,282** |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| (අ) විලම්බිත ආදායම | 08.1 | 2,341,667 | | 2,250,000 | |
| (ආ) පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 11 | 9,866,520 | **12,208,187** | 9,284,028 | **11,534,028** |
| **මුළු වගකීම්** | | | **65,294,103** | | **79,526,310** |
| **මුළු ශුද්ධ වත්කම්** | | | **414,199,158** | | **286,002,779** |
| **ශුද්ධ වත්කම්/හිමිකම්** | | | | | |
| සමුච්චිත අරමුදල | 12 | 38,520,974 | | 46,518,087 | |
| ප්‍රත්‍යාගණනය අතිරික්තය | | 61,989,905 | | | |
| ඉ/ගෙ අතිරික්තය/ ඌණතාවය | 13 | 299,746,747 | | 227,122,461 | |
| නිශ්චිත අරමුදල් | 14 | 13,941,532 | **414,199,158** | 12,362,232 | **286,002,779** |
| **මුළු ශුද්ධ වත්කම්/ හිමිකම්** | | | **414,199,158** | | **286,002,779** |

"පිටු අංක ii සිට vi දක්වා වන ගිණුම්කරණ ප්‍රතිපත්ති හා පිටු අංක 11 සිට 20 දක්වා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන හා බැඳුණු කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කළමණාකරණ මණ්ඩලය වගකීමෙන් බැඳේ. මෙම මූල්‍ය ප්‍රකාශන කළමණාකරණ මණ්ඩලය විසින් අනුමත කොට ඇති අතර ඔවුන් වෙනුවෙන් අත්සන් තබනු ලැබේ,"

මහාචාර්ය එස්. සමිත
අධ්‍යක්ෂ/ ගණන්දෙන නිලධාරී

කේ.ජ්.අයි.එස් රණසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී

# කෘෂිකර්මවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
# පේරාදෙණිය විශ්වවිද්‍යාලය

## 2015 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| | සටහන් | 2015.12.31 | 2014.12.31 |
|---|---|---|---|
| **මෙහෙයුම් ආදායම්** | | රු. | රු. |
| රජයේ ආධාර(පුනරාවර්තන වියදම් සඳහා) | | 19,000,000 | 16,000,000 |
| අනෙකුත් ඉපයීම් | 15 | 103,967,144 | 111,237,960 |
| රජයේ ආධාර මත ක්‍රමක්ෂය | 7 | 12,119,263 | 8,322,129 |
| අනෙකුත් මූලධන වත්කම් මත ක්‍රමක්ෂය | | 5,877,850 | |
| පර්යේෂණ අධාර මත ක්‍රමක්ෂය | F | 15,824,891 | |
| | | **140,964,257** | **135,560,089** |
| | | | |
| **මෙහෙයුම් වියදම්** | | | |
| පෞද්ගලික පඩිනඩි හා වේතන | 16 | 53,634,864 | 46,896,435 |
| ගමන් වියදම් | 17 | 75,692 | 92,045 |
| සැපයුම් හා පරිභෝජන භාණ්ඩ | 18 | 2,519,653 | 3,851,235 |
| නඩත්තුකිරීමේ වියදම් | 19 | 1,083,394 | 1,019,205 |
| කොන්ත්‍රාත් සේවාවන් | 20 | 8,322,628 | 6,766,142 |
| පර්යේෂණ හා සංවර්ධන | | - | - |
| ක්ෂයකිරීම් හා ලියාහැරීම් | 21 | 12,378,752 | 9,602,896 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 22 | 15,436,080 | 21,625,924 |
| බොල් ණය | | 1,154,822 | 950,914 |
| බොල් සහ අඩමාන ණය වෙන්කිරීම | | - | 2,872,912 |
| මූල්‍ය වියදම් | | - | 17,070 |
| පර්යේෂණ අධාර මත වියදම් | F | 15,824,891 | |
| මුළු මෙහෙයුම් වියදම් | | **94,605,885** | **93,694,777** |
| | | | |
| කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය | | **46,358,372** | **41,865,313** |

මහාචාර්ය එස්. සමිත
අධ්‍යක්ෂ/ ගණන්දෙන නිලධාරී

කේ.ජ්.අයි.එස් රණසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී

## කෘෂිකර්මවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය

## 2015 දෙසැම්බර් 31 දිනට ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය

(රුපියල් දහසේ ඒකක මගින්)

| | සමුච්චිත අරමුදල | ප්‍රත්‍යාගණන සංචිතය | පරිවර්තන සංචිතය | එකතුව |
|---|---|---|---|---|
| **2013 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 242,118,213 | - | - | 242,118,213 |
| ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්කම් වලට අනුව නැවත සඳහන්කරන වටිනාකම | - | | | |
| | **242,118,213** | - | - | **242,118,213** |
| වර්ෂය තුල වියදම් කල හා වියදම් නොකල මූලධන ආධාර | 677,871 | - | | 677,871 |
| රජයේ ආධාර මත ක්‍රමක්ෂය | | | | |
| විශේෂ අභ්‍යන්තර අරමුදල් වල වැඩිවීම | 851,748 | - | - | 851,748 |
| පෙර වර්ෂය සඳහා ගැලපුම් | 489,635 | | | 489,635 |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හඳුනා නොගත් ලාභ හෝ පාඩු | - | | | |
| කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය/ ඌනතාවය | 41,865,313 | - | - | 41,865,313 |
| **2014 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **286,002,779** | - | - | **286,002,779** |
| වර්ෂය තුල වියදම් කල හා වියදම් නොකල මූලධන ආධාර | (7,997,113) | | | (7,997,113) |
| රජයේ ආධාර මත ක්‍රමක්ෂය | - | | | - |
| විශේෂ අභ්‍යන්තර අරමුදල් වල වැඩිවීම | 1,579,300 | | | 1,579,300 |
| පෙර වර්ෂය සඳහා ගැලපුම් | 25,442,569 | | | 25,442,569 |
| ප්‍රත්‍යාගණනය අතිරික්තය | - | 62,813,250 | | 62,813,250 |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හඳුනා නොගත් ලාභ හෝ පාඩු | - | | | - |
| අනෙකුත් මූලධන වත්කම් මත ක්‍රමක්ෂය | 823,345 | (823,345.00) | | - |
| | | | | - |
| | | | | - |
| කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය/ ඌනතාවය | 46,358,372 | - | - | 46,358,372 |
| | | | | - |
| **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **352,209,253** | **61,989,905** | - | **414,199,158** |

මහාචාර්ය එස්. සමිත
අධ්‍යක්ෂ/ ගණන්දෙන නිලධාරී

කේ.ජ්.අයි.එස් රණසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී

වක්‍ර ක්‍රමයට මුදල් ප්‍රවාහ ප්‍රකාශය

## කෘෂිකර්මවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය

## 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | සටහන් / උපලේඛණ | 2015 තථ්‍ය | 2014 තථ්‍ය |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | රු. | රු. |
| සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් අතිරික්තය/ ඌනතාවය | 13 | 46,358 | 41,865 |
| | | **46,358** | **41,865** |
| මුදල් නොවන ප්‍රවාහයන් | | | |
| දේපල, පිරියත හා උපකරණ මත ක්ෂය වීම් | 21 | 12,379 | 9,603 |
| පාරිතෝෂික වෙන්කිරීම් | 16 | 582 | 1,058 |
| බොල් හා අඩමාන ණය සඳහා වෙන්කිරීම | 02 | 1,155 | 3,824 |
| විගණන ගාස්තු සඳහා වෙන්කිරීම් | 10 | 225 | 714 |
| සේවක ණය මත පොලී | 15 | (227) | (218) |
| ආයෝජන මත පොලී | 15 | (16,566) | (21,131) |
| පෙර වර්ෂය සඳහා ගැලපුම් | | 26,346 | 614 |
| රජයේ ආධාර මත ක්‍රමක්ෂය | 07 | (12,119) | (8,322) |
| අනෙකුත් මූලධන වත්කම් මත ක්‍රමක්ෂය | | (5,878) | |
| ප¾යේෂණ අධාර මත ක්‍රමක්ෂය | | (823) | |
| දේපල, පිරියත හා උපකරණ විකිණීම මත ලාභය/ අලාභය | 15 | (796) | (601) |
| පාරිතෝෂික ගෙවීම් | | (80) | (1,563) |
| | | - | |
| කාරක ප්‍රාග්ධනය වැඩිවීම/ අඩුවීම | | - | |
| තොගයේ වැඩිවීම/ අඩුවීම | 03 | 209 | 193 |
| විලම්බිත අදායම් වැඩිවීම/ අඩුවීම | 08 | 2,840 | 685 |
| ගෙවිය යුතු ශේෂ වල වැඩිවීම/ අඩුවීම | 09 | (587) | 2,901 |
| උපචිත වියදම්/ වෙන්කිරීම් වල වැඩිවීම/ අඩුවීම | 10 | (17,292) | 3,825 |
| අනෙකුත් ජංගම වත්කම් වල වැඩිවීම/ අඩුවීම | 05 | (1,350) | (561) |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂවල වැඩිවීම/ අඩුවීම | 02 | (8,359) | (4,784) |
| පෙර ගෙවීම් වල වැඩිවීම/ අඩුවීම | 04 | 301 | 637 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **26,317** | **28,738** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම | E | (5,618) | (7,648) |
| පුනරුත්ථාපන වියදම් | E | (2,606) | (5,320) |
| දේපල, පිරියත හා උපකරණ විකිණීම | 15 | 796 | 601 |
| පෙර වර්ෂය සඳහා ගැලපුම් | | 34 | |
| ආයෝජන විකිණීම මත ලාභය/ අලාභය | 06 | (50,071) | (41,841) |
| ආයෝජන මත පොලී | 15 | 16,793 | 21,350 |
| | | - | |
| **ආයෝජන ක්‍රියාකාරකම් මත ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(40,672)** | **(32,858)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| රජයේ මූලධන ආධාර | | 10,000 | 9,000 |
| විගණන ගාස්තු ගෙවීම් | | - | (939) |
| පර්යේෂණ අධාර ලැබීම් | F | 17,404 | |
| පර්යේෂණ අධාර වියදම් | F | (15,825) | (1,948) |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | **11,579** | **6,113** |
| **මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/ අඩුවීම** | | **(2,776)** | **1,992** |
| කාල පරිච්ඡේදය මුල මුදල් හා මුදල් සමාන දෑ | | 4,730 | 2,738 |
| කාල පරිච්ඡේදය අග මුදල් හා මුදල් සමාන දෑ | | 1,954 | 4,730 |
| මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/ අඩුවීම | | (2,776) | 1,992 |

මහාචාර්ය එස්. සමිත
අධ්‍යක්ෂ/ ගණන්දෙන නිලධාරි

කේ.ජ්.අයි.එස් රණසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී

# කෘෂිකර්මවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
# පේරාදෙණිය විශ්වවිද්‍යාලය

## 2015 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම

| | 2015 | 2014 |
|---|---|---|
| | රු. | රු. |
| ඉ/ගෙ ශුද්ධ අතිරික්තය/(ඌණතාවය) | 46,358,372 | 41,865,313 |
| පසුගිය වර්ෂයෙන් ඉ/ගෙ අතිරික්තය/(ඌණතාවය) | 227,122,461 | 184,767,513 |
| | **273,480,833** | **226,632,826** |
| එකතුකලා | | |
| 01. පසුගිය කාළපරිච්චේදයටඅදාල අදායම් | 26,904,709 | 2,023,645 |
| 02. වෙනත් ගැලපුම් - බැර | - | - |
| | **300,385,542** | **228,656,471** |
| අඩුකලා | | |
| 01. ගැලපුම් - සමුච්චිත ක්ෂය කිරීම් | - | - |
| 02. පසුගිය වර්ෂයන්ට අදාල වියදම් | 638,795 | 1,534,010 |
| 03. ගැලපුම් - හර | - | - |
| 04. සමුච්චිත අරමුදලින් කල ප්‍රාග්ධන වියදම් | - | - |
| | 638,795 | 1,534,010 |
| | **299,746,747** | **227,122,461** |

මහාචාර්ය එස්. සමිත
අධ්‍යක්ෂ/ ගණන්දෙන නිලධාරී

කේ.ජී.අයි.එස් රණසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී

05-14/03

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT

30

| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | සීඑල්පී-2/කේඩී/ජේ/පීජීඅයිඒ/<br>01/2015/19 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | |
| දිනය<br>திகதி<br>Date | 2017 මාර්තු 03 දින | | |

14 MAR 2017
PERADENIYA

අධ්‍යක්ෂ,

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති (වැඩබලන)

පිටපත් :- 1. ලේකම් , විශ්වවිද්‍යාල උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය

2. සභාපති , විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

SAB/DR/AR
14/03/2017

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. : සිඑල්පී-2/කේඩී/ජේ/පීජීඅයිඒ/01/2015/19

ඔබේ අංකය / உமது இல. / Your No. :

දිනය / திகதி / Date : 2017 මාර්තු 31 දින

අධ්‍යක්ෂ,

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1979 දෙසැම්බර් 26 දිනැති අංක 68/11 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත නියමාවලියේ 20 වන වගන්තිය සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය, සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය ප්‍රකාර, විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂ වෙත 2016 සැප්තැම්බර් 14 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.



අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

32

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

--------------------

2.1 තත්ත්වාගණනය කළ මතය

---------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

--------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03

---------------------------------------------

අස්තිත්වයන් විසින් ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේදවලදී සිදු වී ඇති වැරදි සොයා ගැනීමෙන් පසුව නිකුත් කරන පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහිම අතීතානුයෝගීව නිවැරදි කිරීම් කළ යුතු වුවත්, ඊට පටහැනි ලෙස 2014 වර්ෂයේ විගණිත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සහ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ පිළිවෙලින් රු.24,723,016 ක් වූ සහ රු. 21,816,514 ක් වූ ගැලපීම්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී සංශෝධනය කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

---------------------------------------------

ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.42,134,565 ක් වූ ස්ථාවර වත්කම් අයිතම 06 ක් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

34

2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------------

සමාලෝචිත වර්ෂයේ දී රු. 682,359 ක් පර්යේෂණ දීමනා ලෙස ගෙවීම් කර තිබුණ ද පර්යේෂණ යෝජනාවලට අනුමැතිය හා ප්‍රගති වාර්තා විගණනයට ඉදිරිපත් නොවුණි.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

ශිෂ්‍යයින් 67 දෙනෙකුගේ විද්‍යාගාර හා පුස්තකාල තැන්පතු එකතුව රු.241,510 ක් නිරවුල් කිරීමට කටයුතු නොකර වර්ෂ 10 කට වැඩි කාලයක් තිස්සේ තැන්පතු ලෙස මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබුණි.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

------------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 156 | 1987, 1995, 2004 හා 2014 වර්ෂවලදී පුස්තකාල පොත් සමීක්ෂණයේදී හඳුනාගත් පරිදි පොත් 11624 ක් අස්ථාන ගත වීම නිසා ආයතනයට සිදු වූ පාඩුව වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. |
| (ආ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ II කොටසේ VIII පරිච්ඡේදයේ 6.2 හි (ii) හා (iii) | තම රාජකාරියට අමතරව කරන සේවාවකින් උපයාගන්නා ගාස්තු ප්‍රමාණයෙන් සියයට 10 ක කොටසක් තමන් අයිති උසස් අධ්‍යාපන ආයතනයට ගෙවිය යුතු වුවද, කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ |

| | | |
|---|---|---|
| | | සමාලෝචිත වර්ෂය තුළ ගෙවන ලද රු.17,805,918 ක බාහිර දේශන ගාස්තුවලින් රු.1,780,591 ක් ගාස්තුව ගෙවන අවස්ථාවේදී අවකරණය කරගෙන විශ්වවිද්‍යාල අරමුදලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.2 ඡේදය | මානව සම්පත් අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.47,077,925 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.45,415,823 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,662,102 ක වර්ධනයක් නිරීක්ෂණය විය. වියදම රු.6,883,444 කින් වැඩිවීමට සාපේක්ෂව ආදායම රු.8,545,547 කින් වැඩිවීම, ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වාම අතිරික්තයක් ඇති වී තිබූ අතර, සේවක පාරිශ්‍රමික සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකීමේදී 2011 වර්ෂයේ රු.58,259,174 ක් වූ ආයතනයේ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී 2015 වර්ෂයේදී රු.113,171,141 ක් වී තිබුණි.

36

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1979 අංක 9 දරන කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතන නියමාවලිය අනුව ආයතනයේ අරමුණු පහත දැක්වේ.

- පශ්චාත් උපාධි පාඨමාලාවන්හී ඉහළ අධ්‍යයන ප්‍රමිතීන් සපුරා ගැනීම හා පවත්වාගෙන යාම.
- පශ්චාත් උපාධිධාරීන් අතර උසස් වෘත්තිය හා නායකත්ව ගුණාංග ඇති කිරීම.
- පශ්චාත් උපාධිධාරීන් තුළ ඉහළ ආචාර ධර්ම හා සදාචාරාත්මක වටිනාකම් ඇති කිරීම.
- සීඝ්‍රයෙන් වෙනස් වන ගෝලීය සංවර්ධනයට අනුවර්තනය විය හැකි පශ්චාත් උපාධිධාරීන් බිහි කිරීම.
- ඉහළ ප්‍රමිතීන්හි මූලික හා ව්‍යවහාරික පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම හා ශිෂ්‍යයන් අතර නවෝත්පාදන පර්යේෂණ සඳහා ශක්‍යතාවය ගොඩනැගීම.
- අධ්‍යයන වැඩසටහන් සංවිධානය හා ක්‍රියාත්මක කිරීම සඳහා දක්ෂ හා කැපවුණු අධ්‍යයන කාර්ය මණ්ඩලයක් සහ කාර්යක්ෂමව පරිපාලන, තාක්ෂණික හා සහායක කාර්ය මණ්ඩලයක් ස්ථාපිත කිරීම.
- දැනුම ව්‍යාප්තිය
- ප්‍රධාන කෘෂිකර්ම තොරතුරු සම්පත් සහිත පුස්තකාලය බවට පත්කිරීම සඳහා පුස්තකාලය වැඩිදියුණු කිරීම.
- ආයතනික ධාරිතාවය ශක්තිමත් කිරීම.
- ආසියානු කලාපයේ හා ඉන් ඔබ්බට පශ්චාත් උපාධි අධ්‍යයන හා පර්යේෂණ මධ්‍යස්ථානයක් ලෙස විශිෂ්ඨත්වය ළඟා කර ගැනීම.

(ආ) කාර්යසාධන තොරතුරු අනුව කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ දර්ශනපති උපාධිය හා ආචාර්ය උපාධිය සඳහා ඉකුත් වර්ෂයට සාපේක්ෂව 2014 හා 2015 වර්ෂවල ශිෂ්‍ය ලියාපදිංචියේ අඩුවීම පිළිවෙලින් සියයට 27 ක් හා සියයට 62 ක් විය.

4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ තීරණ අංක 433.3.3.10 අනුව විශ්‍රාමික නිලධාරියෙකු උපරිම මාස 12 ක කාලයක් කාර්ය පැවරීමේ පදනම මත සේවයේ යෙදවිය හැකි වුවත්, ඊට අනුකූල නොවන පරිදි මාස 18 ක කාලයක් සේවයේ යොදවා වැඩිපුර මාස 06 කාලයක් සඳහා රු.300,000 ක් ගෙවා තිබුණි.

4.3 අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ "සීමිත අරමුදල්" යටතේ දක්වා ඇති පර්යේෂණ ආධාර ව්‍යාපෘති ගිණුම් 03 ක රු.832,678 ක් නිෂ්කාර්යව පැවතුණි.

(ආ) ආයතනයේ අරමුණු හා පරමාර්ථ ළඟාකරගැනීම සඳහා ආයතනයේ අතිරික්ත අරමුදල් යොදාගැනීම වෙනුවට සමාලෝචිත වර්ෂයේදී ආයතනයේ පොදු අරමුදලින් හා පර්යේෂණ අරමුදලින් පිළිවෙලින් රු.289,428,611 ක් හා රු.11,016,356 ක් කාලීන සහ ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.

4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය ආරම්භයේ සිටම පුරප්පාඩුව පැවති මහාචාර්ය තනතුරු 06 ක් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු 04 ක් සඳහා ස්ථිර කථිකාචාර්යවරුන් බඳවා ගැනීමට කටයුතු නොකර සියලුම ඉගැන්වීම් කටයුතු බාහිර කථිකාචාර්යවරුන් 162 ක් යොදාගෙන සිදු කිරීම හේතුවෙන් දේශන ගාස්තුව ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.21,115,750 ක් ගෙවා තිබුණි.

(ආ) ආයතනයේ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිපති 2014 නොවැම්බර් 15 දින විශ්‍රාම ගොස් ඇතත්, සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් එම තනතුර සඳහා ස්ථිර නිලධාරියකු පත්කිරීමට කටයුතු කර නොතිබුණි.

38

5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009(1) දරන විගණන මාර්ගෝපදේශ චක්‍රලේඛය ප්‍රකාරව, සෑම අභ්‍යන්තර විගණන ඒකකයක්ම තම ආයතනය වෙනුවෙන් කාර්තුවකට වරක් අභ්‍යන්තර විගණන වාර්තාවක් පිළියෙල කළයුතු වුවත්, එම වාර්තා අදාල ඉලක්ක දිනයන්හිදී විගණන කමිටුවට ඉදිරිපත් කර නොතිබුණි.

5.2 විගණන කමිටු

2003 ජුනි 02 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව විගණන කමිටුව විසින් තම නිරීක්ෂණ, නිර්දේශ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමක් කර නොතිබූ අතර, විගණන කමිටුව විසින් ඉටු කළ යුතු පහත සඳහන් කරුණු ඉටු කර නොතිබුණු බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(අ) වාර්ෂික වාර්තාවට ඇතුළත් කිරීම සඳහා නිරීක්ෂණයන් ඇතුළත් කමිටු වාර්තා ඉදිරිපත් කිරීම

(ආ) රාජ්‍ය ව්‍යාපාර කමිටුවට ඉදිරිපත් කරන ලද යෝජනා / මහපෙන්වීම් පිළිබඳ සමාලෝචනය

(ඇ) අභ්‍යන්තර / බාහිර විගණන වාර්තා කළමනාකරණ ලිපි සම්බන්ධයෙන් සමාලෝචනය හා ඉදිරි ක්‍රියා මාර්ග ගැනීම.

5.3 ප්‍රසම්පාදන සැලැස්ම

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණද, අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් කර නොතිබුණු අතර, ඊළඟ එළඹෙන වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව හා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම මාස 06 ක් නොඉක්මවන කාලය අතරතුර ක්‍රමවත්ව යාවත්කාලීන කර නොතිබුණි.

39

5.4 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී විෂයයන් 56 ක සියයට 6 සිට සියයට 100 ක් දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | අරමුදල් උපයෝජනය | අදාළ අරමුණු ඉටුකර ගත හැකි වන පරිදි ප්‍රදාන උපයෝජනය කර නොතිබීම. |
| (ආ) | පොත්පත් හා ලේඛන පවත්වා ගැනීම | මුදල් රෙගුලාසි සහ අදාළ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබීම. |

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

**කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය**
**විගණන වාර්තාවට අදාල පිළිතුරු වාර්තාව**

විමසීම් අංකය: CLP-2/KD/J/PGIA/DF/01/2015/19 දිනය : 2017.04.06
ලිපි යොමුව : විගණකාධිපති - විගණකාධිපති කාර්යාලය
විෂය : විගණනය වාර්තාව

..............................................................................................................................................

| | | |
|---|---|---|
| 2 | | **මූල්‍ය ප්‍රකාශන** |
| 2.2 | | **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම** |
| | 2.2.1 | **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිති අංක 03** |
| | | **(අ)** ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 අනුව 2016 වර්ෂයේදී හදුනාගන්නා ලද 2014 වර්ෂයට අදාල ගිණුම්කරණ අඩුපාඩු හා ඇස්තමේන්තු වෙනස් වීම් 2015 වර්ෂයේ සංශෝධිත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී 2014 වර්ෂයට අදාලව නිවැරදි කිරීම් කර ඉදිරිපත් කර ඇති අතර 2014 වර්ෂයට පෙර වර්ෂයන්ට අදාලව සිදුවී ඇති ගිණුම්කරණ අඩුපාඩු හා ඇස්තමේන්තු වෙනස්වීම් පොදු සංචිතයට ගැලපීම් ද ඇතුලත් සංශෝධිත මූල්‍ය ප්‍රකාශන කළමණාකරණ මණ්ඩලයේ අනුමැතිය මත විගණනය සඳහා ඉදිරිපත් කරන ලදි 2014 වර්ෂයේ අදාල සංශෝධන සහිත මූල්‍ය ප්‍රකාශන 2016 නොවැම්බර් මස 27 දින පැවැති 226 වැනි කලමණාකරණ මණ්ඩලය මගින් අනුමත කරන ලදි. |
| | | **(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිති අංක 07** |
| | | රු.31,885,518.00 ක් වටිනා පුස්තකාල පොත් සහ වාර ප්‍රකාශන ප්‍රත්‍යාගණනය කිරීම සඳහා 2016 ජූලි මස පැවති කළමණාකරණ මණ්ඩලයේ අනුමැතියට යටත්ව අධ්‍යක්ෂකතුමාගේ නිර්දේශයෙන් කමිටුවක් පත්කර ඇති අතර ඒ අනුව ඉදිරියේදී ප්‍රත්‍යාගණන කටයුතු කර අගය ගිණුම්වල ගැනීමට කටයුතු කරමි. |
| | | මෝටර් රථ ප්‍රත්‍යාගණනය කර 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම් කර ඉදිරිපත් කර ඇත. |
| | | මෘදුකාංග, ලී බඩු, කාර්යාල උපකරණ, රසායනාගාර සහ ඉගෙනුම් උපකරණ ප්‍රත්‍යාගණනය කිරීම සඳහා විගණන කමිටුවේ නිර්දේශය හා කළමණාකරණ මණ්ඩල අනුමැතියට යටත්ව ආයතනයේ අධ්‍යක්ෂකවරයා විසින් අදාල වත්කම් ප්‍රත්‍යාගණනය පිළිබඳ දැනුම ඇති ප්‍රවීණයෙකුගෙන් සමන්විත අභ්‍යන්තර කමිටුවක් පත්කර මේ වනවිටත් ප්‍රත්‍යාගණන කටයුතු කරන අතර අදාල ප්‍රත්‍යාගණන කටයුතු අවසන් වූ වහාම මෙම ප්‍රත්‍යාගණන වටිනාකම් ගිණුම්වල ගැලපීමට කටයුතු කරනු ලැබේ. |
| | 2.2.2 | **විගණනය සඳහා සාක්ෂි නොවීම** |
| | | උක්ත විගණන විමසුම සඳහා අපගේ පැහැදිලි කිරීම් පහත සඳහන් කර ඇත. විශ්වවිද්‍යාල පද්ධතිය තුල පහත සඳහන් සේවකයින් වෙත පර්යේෂණ දීමනා ගෙවනු ලැබේ.<br><br>1. සියලුම ස්ථිර සේවයේ කථිකාචාර්යවරුන්<br>2. ජ්‍යෙෂ්ඨ මට්ටමේ විධායක නිලධාරීන්<br><br>ඒ අනුව කථිකාචාර්යවරුන් හා සම්බන්ධයෙන් ඔවුන්ගේ පීඨය විසින් පිහිටුවා ඇති පර්යේෂණ කමිටු වෙත ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ යෝජනාවන් එකී පර්යේෂණ |

| | | | |
|---|---|---|---|
| | | කමිටුවේ නිර්දේශය ප්‍රකාරව සනාථන සහා පර්යේෂණ කමිටුව විසින් අනුමත කිරීමෙන් පසුව පර්යේෂණ දීමනාව ගෙවනු ලබන අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ විධායක නිලධාරීන් සම්බන්ධයෙන් ඔවුන් විසින් ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ යෝජනාවන් සනාතන සහා පර්යේෂණ කමිටුව විසින් පත් කරන ලද අනුකමිටුව අධීක්ෂණය කොට එහි නිර්දේශය ප්‍රකාරව සනාතන සහා පර්යේෂණ කමිටුවේ අනුමැතිය මත ගෙවනු ලබයි.<br><br>විගණන විමසුමේ සඳහන් පරිදි 2014-02-11 දින මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද 02/2014 දරන චක්‍රලේඛය ප්‍රකාරව මාස 06 ක් තුල අදාල පර්යේෂණයේ ප්‍රගතිය ඇතුලත් අන්තර් වාර්තාවක් ලබා ගත යුතු බව සඳහන් වුවද පසුව 2014-05-28 දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 05/2014(ස) මගින් පර්යේෂණ දීමනා ගෙවීම සම්බන්ධයෙන් වූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා 01/2011 සහ 01/2011(i) යන චක්‍රලේඛ දෙක බලාත්මක කර ඇත.<br><br>තවද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 69 ප්‍රකාරව දක්වා ඇත්තේ රජය විසින් කලින් කලට නිකුත් කරනු ලබන චක්‍රලේඛ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම හා අනෙකුත් විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන සඳහා අදාල කර ගත හැක්කේ එකී චක්‍රලේඛයන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අන්තර්ග්‍රහනය කිරීමෙන් පසුව පමණක් බවයි. ඒ අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යම් යම් සංශෝධනයන්ට යටත්ව අන්තර්ග්‍රහණය කර ඇති 01/2011 හා 01/2011(i) යන චක්‍රලේඛ දෙක පර්යේෂණ දීමනා ගෙවීම සම්බන්ධයෙන් බලාත්මක කර ඇති අතර එකී චක්‍රලේඛ ප්‍රකාරව සෑම මාස 06 කට වරක් ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවයක් පර්යේෂණ දීමනා ලාභීයාට නොමැත.<br><br>එබැවින් විශ්වවිද්‍යාල අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩල සඳහා 2015 වසරේ සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා ගෙවා ඇති පර්යේෂණ දීමනාව දැනට විශ්වවිද්‍යාල පද්ධතිය තුල බලාත්මක වී ඇති චක්‍රලේඛ ප්‍රකාරව සිදු කර ඇති බවත් එකී චක්‍රලේඛ ප්‍රකාරව පර්යේෂණ ආරම්භ කල දින සිට මාස 06 ක් තුල ප්‍රගතිය ඇතුළත් වාර්තා ඉදිරිපත් කිරීමට අවශ්‍ය නොවන බවත් දන්වා සිටිමි.<br><br>අදාල චක්‍රලේඛ ප්‍රකාරව ඉදිරිපත් කරන ලද පර්යේෂණ යෝජනා සනාථන සහා පර්යෛෂණ අංශය සතුව පවතී. **(ඇමුණුම 01)** | |
| | 2.3 | **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්** | |
| | | (අ) | ශිෂ්‍යයන් 67 දෙනෙකුට අදාලව විද්‍යාගාර හා පුස්තකාල තැන්පතු ලෙස ගිණුම්ගත කර ඇති රු.241,510.00 ක මුදල ගෙවා නිරවුල් කිරීම සඳහා අදාල රිසිට්පත් සමඟ ඉදිරිපත් කරන ලෙස දන්වා සියලුම සිසුන්ට මේ වන විටත් ලිපි යොමු කර ඇත. **(ඇමුණුම 02)** ඒ අනුව 2017 වර්ෂය තුලදී අදාල මුදල් ගෙවා නිදහස් කිරීමට හෝ ආයතනයේ ආදායමට බැර කිරීමට කටයුතු කරමි. |
| 2.4 | **නීති රීති රෙගුලාසි හා කළමණාකරණ තීරණ ආදියට අනුකූල නොවීම** | | |
| | (අ) | | • අවුරුදු කිහිපයක් අඛණ්ඩව විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කළ විගණන විමසුම් හේතු කොට ගෙන කෘෂි පුස්තකාලයේ පොත් පත් හා වාර සඟරා භෞතිකව සත්‍යාපනය කිරීමේ කටයුතු 2014 ජූලි මස ආරම්භ කරන ලදී. එවකට සේවයේ යෙදී සිටි පුස්තකාලයාධිපතිනිය 2014 වර්ෂය අවසානයේ විශ්‍රාම ගැනීමට නියමිතව සිටි බැවින්, කෘෂි පුස්තකාලය කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සහ කෘෂිකර්ම පීඨයේ සිසුන් සඳහා සේවය සපයන බැවින් මෙම කාර්යය සඳහා කෘෂි පුස්තකාලයේ වසා තැබීමේ දුෂ්කරතාවය යන හේතු කොට ගෙන වර්ෂයක් පාසා පුස්තකාල පොත් සත්‍යාපනය කිරීම දුෂ්කර විය. මෙම සත්‍යාපන කටයුතු කෘෂිකර්මවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයට සම්පූර්ණයෙන්ම පරිබාහිර වූ මණ්ඩලයක් මඟින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපතිනියගේ ප්‍රධානත්වයෙන් ඉටු කිරීමට උපකුලපතිවරයා විසින් අනුමැතිය දෙන ලදී. එම කමිටුව එහි මුල් වාර්තාව 05-09- |

2014 දින කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂකවරයා වෙත යොමු කොට ඇත.

- 09-09-2014 දින ලිපිය මගින් ඒ පිළිබඳව නිරීක්ෂණ ලබා දෙන ලෙස එවකට කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුස්තකාලයාධිපතිනියගෙන් කළ ඉල්ලීමකට අනුව 05-03-2015 දිනැති ලිපිය මගින් ඇයගේ නිරීක්ෂණ ලබා දෙන ලදී.
- මෙම කාල සීමාව තුළ පුස්තකාල සේවක මණ්ඩලය සහ පුස්තකාලයාධිපතිනිය විසින් අස්ථාන ගතවී ඇතැයි වාර්තා වූ පොත් අතුරින් සොයා ගත් පොත් සහ වාර සඟරාවල මිල අඩු කොට සංශෝධිත අවසාන සත්‍යාපන වාර්තාව 25-11-2014 දින පුස්තකාලයාධිපතිනිය විසින් ආයතනයේ අධ්‍යක්ෂකවරයා වෙත යොමු කරන ලදී.
- 210 සහ 211 දරණ කළමණාකරණ මණ්ඩල රැස්වීම් වලදී (27-11-2014 සහ 30-01-2015 දින වලදී පැවැති) ගත් තීරණ පරිදි මෙම වාර්තාව සලකා බැලීම සඳහා කළමණාකරණ මණ්ඩල සාමාජිකයින් සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය කළමණාකරණයකින්ද සමන්විත වූ කමිටුවක් පත් කරන ලදී. එම කමිටුව 20-02-2015 වන දින රැස්වූ අතර අස්ථාන ගත වී ඇතැයි වාර්තා වූ පොත් සහ වාර සඟරා වල මිල ගණන් එතෙක් ආයතනය වෙත ලබා දී නොතිබුණු බැවින් එම මිල ගණන් ලබා දෙන ලෙස පේරාදෙණිය පුස්තකාලයාධිපතිවරයා විසින් ඉල්ලීමක් කරන ලදී. අස්ථානගත වූ පොත් පත් වල මිල ගණන් 05-03-2015 දින ආයතනයට ලබා දුන් අතර 12-03-2015 දින යථෝක්ත අනු කමිටුව ඒ පිළිබඳව කටයුතු කිරීමට රැස්වීමක් පවත්වන ලදී.
- කෙසේ වුවද එම උප කමිටුවේ සාමාජිකයින් දෙදෙනෙකුගේ කළමණාකරණ මණ්ඩල සාමාජිකත්වය 2015 මාර්තු මස 17 වන දිනට අවසන් වූ බැවින් (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂමේ ඉල්ලීමක් මත) මෙම කාර්යය පිළිබඳව දෙවන උප කමිටුවක් 2015 අප්‍රේල් මස අධ්‍යක්ෂකවරයා විසින් කළමණාකරණ මණ්ඩලයේ අනුමැතියට යටත්ව පත් කරන ලදී.
- එම උප කමිටුව 13-05-2015 සහ 12-06-2015 දින රැස්වීම් පවත්වා ඒ සඳහා ඔවුන්ගේ නිර්දේශ ලබා දී ඇත.
- 13-05-2015 දිනැති රැස්වීමේ අතුරු වාර්තාව අනුව නැති වූ පොත් පත් සහ වාර සඟරා සම්බන්ධයෙන් එවකට සිටි පුස්තකාලයාධිපතිනියට වගකීමක් පැවරිය නොහැකි බව කළ නිර්දේශය 29-05-2015 දිනැති කළමණාකරණ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කොට ලබා ගත් අනුමැතිය මත ඇයගේ සේවක අර්ථ සාධක අරමුදල නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු ආයතනය විසින් ඉටු කරන ලදී. 1975 සිට 2014 යන කාලය දක්වා අවස්ථා 04දී පුස්තකාල පොත් සහ වාර සඟරා පිළිබඳ භෞතික සත්‍යාපන කටයුතු ඉටු කළද එම අවස්ථාවල නැති වී ඇතැයි වාර්තාවූ පොත් පත් සහ වාර සඟරා පිළිබඳ නිසි ක්‍රියාමාර්ග ආයතනය විසින් ඒ ඒ කාල වලදී නොගත් බැවින් මෙම තීරණය එම කමිටුව විසින් ගන්නා ලදී.
- කෙසේ වුවද පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ නියෝජ්‍ය අභ්‍යන්තර විගණක ඔහුගේ 2015-07-10 දිනැති ලිපිය මගින් කළමණාකරණ මණ්ඩලයේ නිර්දේශ පිළිගත නොහැකි බවත් අස්ථානගත වී ඇති පොත් පත් වල වටිනාකම පිළිබඳව කටයුතු කිරීම අවසන් වනතුරු ඇයගේ අර්ථ සාධක අරමුදල නිදහස් කළ නොහැකි බවත් දන්වා ඇයගේ පෞද්ගලික ලිපි ගොනුව නැවතත් ආයතනයට භාර දී ඇත. අස්ථානගත වූ පොත් පත්වල වටිනාකම රුපියල් ලක්ෂ 05ක් ඉක්මවීම ඔහුගේ මෙම තීරණයට පාදක විය.
- උප කමිටුව ඔවුන්ගේ අවසන් වාර්තාව 07-08-2015 දින ආයතනයේ අධ්‍යක්ෂකවරයාට ලබා දී ඇත. මෙම වාර්තාව 07-08-2015 මස පැවැත්වූ විශේෂ විගණන කමිටුවට ඉදිරිපත් කරන ලදී. පසුව එම වාර්තාවේ සංස්කරණය කරනු ලැබූ අවසන් වාර්තාව සහ 2015-09-27 දින පැවැත්වූ කළමණාකරණ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කරන ලදී.
- එකී කමිටුවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපතිවරයා සමාජිකයකු ලෙස කටයුතු කළ බැවින් එකී කමිටුවේ සංයුතිය පිළිබඳව ප්‍රශ්නයක් පැන නැඟුණු අතර නැවත වරක් මෙම කාර්යය ඉටු කර ගැනීම සඳහා දෙවන අනු කමිටුවක් 22-07-2015 දින අමාත්‍යාංශ ලේකම්වරයා විසින් පත් කරන ලදී. තවද, මෙම කාල සීමාව තුළදී අස්ථාන ගත වී ඇති පොත් පත් සහ වාර සඟරා වල වර්තමාන මිල ගණන්

| | | |
|---|---|---|
| | | පිළිබඳව වාර්තාවක් විශේෂඥවරයකු හරහා ලබා ගැනීමට ආයතනය විසින් කටයුතු කරන ලදී. ඔහුගේ එම වාර්තාව 20-06-2016 වන දින අධ්‍යක්ෂකවරයා වෙත යොමු කොට ඇත. ඒ අනුව මෙම සියලු වාර්තා 30-09-2016 දින පැවති කළමණාකරණ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කරන ලදී. ඒ පිළිබඳව ඉදිරි කටයුතු කිරීමට කළමාණාකරණ මණ්ඩලය විසින් ආයතනය වෙත නිර්දේශ කරන ලදී.<br>• මෙම කාල සීමාව තුළදී කළමණාකරණ මණ්ඩලය විසින් අස්ථාන ගතවූ පොත් පත්වල වටිනාකම රඳවා ගෙන අර්ථ සාධක අරමුදලේ ඉතිරිය පුස්තකාලයාධිපතිනියට ගෙවීමට තීරණය කොට එම තීරණය ඇයට දැන්වූවද ඇය විසින් එය ප්‍රතික්ෂේප කරන ලදී. තවද, මේ සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුවේ පවත්වනු ලබන විමර්ශනයකදී සහකාර කම්කරු කොමසාරිස්වරයා විසින්ද මෙම තීරණය ක්‍රියාත්මක කරන ලෙස ආයතනයට දැන්වූවද පුස්තකාලයාධිපතිනිය ඒ පිළිබඳව සිය අකැමැත්ත ප්‍රකාශ කොට ඇත.<br>• කෙසේ වුවද අස්ථානගතවූ පොත් පත් හා වාර සඟරාවල වටිනාකම රුපියල් ලක්ෂ 5ට වඩා අඩු වූ හෙයින් (රු.464,144.86) සහ මේ පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීමට පත් කළ උප කමිටුවේ නිර්දේශයක් **(ඇමුණුම් 03)** වූ අයි. මුදන්නායක මහත්මියට පමණක් අස්ථානගත වූ පොත්පත් වල වගකීම පැවරිය නොහැකි යැයි කළ නිර්දේශය 2016-11-25 වැනි දින පැවැත්වූ 226 වැනි කළමණාකරණ මණ්ඩලය **(ඇමුණුම් 04)** විසින් අනුමත කර ලද හෙයින් එම නිර්දේශය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2017-01-28 දින පැවැත්වූ 459 වැනි පාලක සභාවට **(ඇමුණුම් 05)** ඉදිරිපත් කිරීමෙන් පසුව එම වටිනාකම වූ රු.464,144.86 කපා හැරීමට අනුමැතිය ලැබිණි. ඒ අනුව අදාල වටිනාකම ජර්නල් පතක් මඟින් කපා හැරීමට දැනටමත් කටයුතු කර ඇත. |
| | (ආ) | **විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය** |
| | | මෙම ආයතනයේ මූලික වශයෙන් බාහිර දේශකවරුන් ලෙස සේවය සපයනු ලබන්නේ විශ්වවිද්‍යාලවල සේවය කරනු ලබන අධ්‍යයන කාර්ය මණ්ඩලය විසිනි. බොහොමයක් දේශන සති අන්ත හා නිවාඩු දිනවල පවත්වනු ලැබේ. එසේම අත්‍යවශ්‍ය අවස්ථාවලදී පමණක් සතියේ දිනවල දේශන කිහිපයක් පවත්වනු ලැබේ.<br><br>තවද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 04/2016 හා 2016-03-01 දිනැති චක්‍රලේඛය ප්‍රකාර ස්වයං අරමුදල් සම්පාදන ක්‍රියාකාරකම්වලින් ආදායම් උපයනු ලබන කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ ඉපයුම්වලින් උපයන විට ගෙවන බද්ද අඩු කරනු ලැබේ නම් විගණන විමසුමේ සඳහන් රාජ්‍ය භාගය අඩු කිරීමට අවශ්‍ය නොවන බව සඳහන් කර ඇත. ආයතනයේ බාහිර කතිකාචාර්යවරුන් ලෙස සේවය කරනු ලබන විශ්වවිද්‍යාලවල ස්ථිර කාර්ය මණ්ඩලයේ සේවය කරනු ලබන ආචාර්ය මණ්ඩල සාමාජිකයිනගෙන් උපයන විට ගෙවන බද්ද මේ වන විටත් අඩු කරන බැවින් රාජ්‍ය භාගය අය කිරීමක් සිදු කරනු නොලැබේ. එසේම විශ්වවිද්‍යාලයීය ආයතන සංග්‍රහයේ II කොටසේ III පරිච්ඡේදයේ 62 (II), හා (III) ප්‍රකාරව උසස් අධ්‍යාපන ආයතනවලින් වූ අමතර ඉපයීම් වලින් 10% ක් ගෙවීමට අවශ්‍යතාවයක් වන බව සඳහන් වුවද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 291 මගින් එහි අවශ්‍යතාවයක් නොවන පරිදි සංශෝධනය කර ඇත. **(ඇමුණුම් 06)** |
| | ඇ) | කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය පේරාදෙණිය විශ්වවිද්‍යාලය හා අනුබද්ධ ආයතනයක් වන බැවින් කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ නියමාවලියට අනුව හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අංක 233 හා 1983-06-30 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව මෙම ආයතනයේ සේවය කරන කාර්ය මණ්ඩලය බඳවා ගැනීම පේරාදෙණිය විශ්වවිද්‍යාලය හා සම්බන්ධ වී සිදු කරනු ලැබේ. මෙම බඳවා ගැනීමේ පටිපාටිය පේරාදෙණිය විශ්වවිද්‍යාලය මගින් සිදු කිරීමේදී ගත වන කාලය සැලකිල්ලට ගෙන එහි මූලික අදියරේ කටයුතු වන අයදුම් පත් කැඳවීම්, විභාග හා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම හා තේරීම් කටයුතු මෙම ආයතනයේ තෝරා පත් කර ගත් කමිටුවක් මගින් සිදු කර කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය මත පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර එම අනුමැතිය මත පේරාදෙණිය විශ්වවිද්‍යාලය මගින් පත්වීම් ලිපි නිකුත් කරනු |

| | | |
|---|---|---|
| | | අතර සේවකයින්ගේ පෞද්ගලික ලිපි ගොනු විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන ආයතන අංශයේ පවත්වා ගෙන යනු ලැබේ. ඒ අනුව මෙම ආයතනයේ සේවය කරන කාර්ය මණ්ඩලය සඳහා වූ මානව සම්පත් ලේඛණය පිළියෙල කිරීම පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසින් සිදු කරනු ලැබේ. කෙසේ වුවද ඉදිරියේදී කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මානව සම්පත් ලේඛණයක් පිළියෙල කරමින් පවතී. |
| 3 | මූල්‍ය සමාලෝචනය | |
| | 3.2 | **විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**<br>(අ) , (ආ)<br>ජංගම අනුපාතය 0.98:1 ක් වශයෙන් හා මුදල් අනුපාතය 0.37 : 1 ක් වශයෙන් අවම මට්ටමක පැවතියද අප ආයතනය සතු රු 300,449,966 ක් වන ඉහල ද්‍රවශීලතාවයක් සහිත බැංකු ස්ථාවර තැන්පතු අපගේ මූල්‍යමය ස්ථාවරත්වය සනාථ කරනු ලබයි.<br>එමෙන්ම භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රතිපාදන සීමිත බැවින් අප ආයතන ඉපයුම් ද වියදම් ආවරනය සඳහා යොදාගත්තද ඉදිරි සැලසුම් වෙනුවෙන් තැන්පතු ගොඩනගා ගැනීමේ හැකියාවද අප ආයතනය සතුව පවති. ඒ අනුව ද්‍රවශීලතා මට්ටම අප ආයතනයේ ස්වභාවය මත ඉහළ අගයක පවතී. |
| | | |
| 4 | මෙහෙයුම් සමාලෝචනය | |
| | 4.1 | **කාර්ය සාධනය** |
| | 4.1 ආ) | පශ්චාත් උපාධි පාඨමාලා හදාරන මෙම ආයතනයේ සිසුන් සඳහා රජයේ ආධාර නොලැබෙන බැවින් පාඨමාලා සඳහා බඳවා ගනු ලබන ශිෂ්‍යයින්ගෙන් අය කරනු ලබන ගාස්තු මගින් ආයතනය විසින් උපයන ආදායමින් පාඨමාලා වෙනුවෙන් දරන සියලුම වියදම් දැරිය යුතුව ඇත. එබැවින් කාලානුරූපව සිදුවන ඉහල යන වියදම්වලට මුහුණ දීම සඳහා පාඨමාලා ගාස්තු ඉහල නැංවිය යුතුව ඇත. එසේම තමන් විසින් හදාරනු ලබන පාඨමාලා තීරණය කිරීමේදී ඔවුන්ටම සීමා වූ පෞද්ගලික හේතු සාධක ආර්ථික අපහසුතාවයන්වල කාල සීමාවන්වල රැකියා කටයුතු හා නිවාඩු ගැනීම් වැනි හේතූන් මත ඒ පිළිබඳව තීරණ ගැනීම සිසුන් සතු කාර්යයක් හා වගකීමක් වේ. එමෙන්ම වර්තමානයේ උසස් උපාධි ඉගැන්වීම සඳහා පෞද්ගලික විශ්වවිදනල බිහිවී ඇති බැවින් පශ්චාත් උපාධි හැදෑරීම සඳහා සිසුන් බඳවා ගැනීමේදී ආයතනයට අතිශය තරගකාරී බවකට මුහුණ පෑමට සිදුවේ. ඒ අනුව එම විශ්වවිද්‍යාල අතර සිසුන් බෙදී යාමක් සිදුවී ඇත. ඒ අනුව කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පශ්චාත් උපාධි පාඨමාලාවන් හැදෑරීම සඳහා සිසුන් යොමු වීමේ අඩුවක් දක්නට ඇති බව දන්වා සිටිමු. මෙම කරුණ පිළිබඳව මෙම ආයතනයේ අවධානය යොමු කර ඇති අතර බඳවා ගැනීම් ඉහල නැංවීම පිණිස ක්‍රියාමාර්ග සැලසුම් කර ඇත. මේ කරුණු සැලකිල්ලට ගත් ආයතනය උගන්වනු ලබන සියලුම පාඨමාලා ආයතනය සතු සම්පත් උපයෝගී කරගෙන පර්යේෂණ උපාධි හැදෑරීම සඳහා ප්‍රවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු සම්පාදනය කර ඇත. ඊට අමතරව මේවා පිළිබඳව ප්‍රචාරක පත්‍රිකා විශ්වවිද්‍යාල හා රාජ්‍ය/රාජ්‍ය නොවන ආයතන වෙත යැවීම ඉලක්ක ගත ශිෂ්‍ය ප්‍රජාව සඳහා ප්‍රවර්ධන දේශන පැවැත්වීම ආයතනයේ තොරතුරු පද්ධතිය හරහා මේ පිළිබඳව යාවත්කාලීන තොරතුරු ලබා දීම යනාදිය මේ අතර වේ. තවද මූල්‍ය අපහසුකම් වලට මුහුණ පාන සිසුන්ට අඩු පොලී සහිත ණය පහසුකම් බැංකු හරහා ලබා දීම සහ ණය පත් (credit card) හරහා පාඨමාලා ගාස්තු ගෙවීමට සිසුන්ට අවශ්‍ය පහසුකම් සලසා ඇත. මෙම සියලු කරුණු බඳවා ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග වේ. |
| | 4.2 | **මතභේදයට තුඩුදෙන ගනුදෙනු** |
| | | මෙම ආයතනයේ සහකාර ලේඛකාධිකාරී තනතුරේ සේවය කල කේ එස් කේ හේරත් මහත්මිය ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ නිර්දේශය මත වසර දෙකක වැටුප් රහිත නිවාඩු ලැබ විදෙස් ගත වූ අතර එම තනතුරට අදාල රාජකාරී කටයුතු කෙටිකාලීන පදනම මත ආවරණය කළ නොහැකි බැවින් තනතුරේ |

වැඩ බැලීම සඳහා පූර්ණ කාලීණව පුද්ගලයෙකු බඳවා තැනීමට ආයතනයට අවශ්‍ය විය. විශ්වවිද්‍යාලයක ක්‍රියාත්මක වන්නාවූ සියලුම ක්‍රියාකාරකම් මෙම ආයතනයේද ඉටුකිරීමට ඇති බැවින් දැනට ආයතනයේ සේවය කරන නිළධාරින් දෙදෙනාගෙන් එක් අයෙකු නොමැති විට එක් නිළධාරියෙකුට පමණක් පූර්ණකාලීණව ආවරණය කළ නොහැකි බැවින් ආයතනය විසින් මෙම තීරණය ගන්නා ලදී. ඒ අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් පිරිස් පාලන අංක UGC/HR/1/2/380 2015-07-15 දිනැති ලිපියෙන් විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ පරිච්ඡේද 3 අංක 6 ප්‍රකාරව යථෝක්ත තනතුර වැඩ ආවරණය කිරීම පිණිස කෙනෙකු බඳවා ගන්නා ලෙස උපදෙස් ලබා දී ඇත. ඒ අනුව, මාස 18ක කාලයක් සඳහා කාර්යය පැවරුම් පදනම මත විශ්වවිද්‍යාල සේවයෙන් විශ්‍රාමගත් නිලධාරි මහතකු සේවයට බඳවා ගන්නා ලදී. තවද, ප්‍රථම මාස 12 සේවා කාලයෙන් පසුව වෙනත් අයකු බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවුවද ඒ සඳහා 2016-09-23 දින පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයේදී එම තනතුර සඳහා ලබා දුන් නියමිත කාලය තුළදී අයදුම් කළ එකම අයදුම්කරුවා එම තනතුර සඳහා බඳවා ගැනීමට තරම් ශක්‍යතාවයක් නොපෙන්වූ බැවින් මුලින් එම තනතුරේ වැඩ ආවරණය කළ නිලධාරීවරයා සඳහා නව පත්වීමක් 2016-04-10 වැනි දින සිට බලාත්මක වන පරිදි කාර්යය පැවරුම් පදනම මත ලබාදීමට කටයුතු කරන ලදී. **(ඇමුණුම් 07, 08)** මෙම ආයතනය විසින් ස්ථිර තනතුරකට විශ්‍රාම ලත් නිලධාරියකු ස්ථිර තනතුරකට බඳවා ගැනීමට කටයුතු කර නොමැති බව අවධාරණය කරන ලද අතර ඔහුගේ සේවය 2017-04-04 වන දින සිට අවසන් කිරීමට කළමණාකරණ මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

4.3 **අරමුදල් ඌන උපයෝජනය**

(අ) **ඒ සුගීර්දරන්, ජේ නිමලන්, එල් ප්‍රදීපන්**

ආයතනයේ දර්ශනශූරි උපාධිය සඳහා ලියාපදිංචි වූ සිසුන් 03 දෙනෙකුට අදාලව HETC ව්‍යාපෘතිය මගින් ලබාදුන් පර්යේෂණ ආධාර වලින් එම සිසුන් ආයතනය සමඟ සම්බන්ධ වී කරනු ලබන කටයුතුවලදී දරනු ලබන වියදම් සඳහා අදාල ව්‍යාපෘති මෙහෙයුම් කාර්යාල මගින් මෙම අරමුදල් ආයතනය වෙත ලබා දී තිබුණි.

කෙසේ වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අදාල පර්යේෂණ ව්‍යාපෘති ගිණුම්වල පවතින ශේෂ වලින් තවදුරටත් දැරිය යුතු වියදම් තිබේ නම් කඩිනමින් එම බිල්පත් ගෙවීම සඳහා ඉදිරිපත් කරන ලෙසත් එසේ නොමැතිනම් එම ශේෂයන් අදාල ව්‍යාපෘති කාර්‍යාල වෙත මාරුකර හැරීමටත් කටයුතු කරන බව දන්වා මේ වනවිටත් මෙම සිසුන්ට ලිපි යොමු කර ඇත.

| නම | අනුමත මුදල රු. | වියදම රු. | ශේෂය රු. |
|---|---|---|---|
| ඒ සුගීර්දරන් | 152,000.00 | - | 152,000.00 |
| ජේ නිමලන් | 1,980.000.00 | 1,605,977.66 | 374,022.34 |
| එල් ප්‍රදීපන් | 1,525,000.00 | 1,218,343.70 | 306,656.30 |

(ආ) කෘෂිකර්මවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් අවශ්‍යතාවයෙන් වාර්ෂික අයවැය මගින් වෙන් කරනු ලබන අරමුදල පසු ගිය වසර 3 සඳහා පහත පරිදි වේ.

| | 2013 | 2014 | 2015 |
|---|---|---|---|
| මු අයවැය ඇස්තමේන්තුව | 61,527 | 85,205 | 85,250 |
| රජයේ ආධාර | 19,000 | 16,000 | 19,000 |

| | | | |
|---|---|---|---|
| ආයතනය මගින් උපයන ලද ආදායම | 59,444 | 89,505 | 87,401 |
| ප්‍රතිශතය(රජයේ ආධාර මත ආවරණය වන %) | 30% | 18.8% | 22.29% |
| පොළී ආදායම | 27,511 | 21,131 | 16,566 |

ඒ අනුව ආයතනයේ සමස්ථ අරමුදල් අවශ්‍යතාවයෙන් රජයේ ආධාර මගින් ලබා දෙන ප්‍රතිශතය 18% - 30% ත් අතර වේ. ඒ අනුව ආයතනයේ සියලුම සාමාන්‍ය ක්‍රියාකාරකම් වෙනුවෙන් පාඨමාලා ගාස්තු හා අනෙකුත් ගාස්තු වලට අමතරව පොලී ආදායමද අත්‍යවශ්‍ය වේ. එසේම ආයතනයේ නියමාවලියට අනුව පිළියෙල කල සංයුක්ත සැලැස්මට අනුව හඳුනාගත් ප්‍රධාන ක්‍රියාකාරකම් වෙනුවෙන් පසු ගිය වසර 3 තුල පහත පරිදි වියදම් දරා ඇත.

| | 2013 | 2014 | 2015 |
|---|---|---|---|
| පශ්චාත් උපාධි පරීක්ෂණ | 1,002,000 | 28,000 | 103,000 |
| අධ්‍යයන පර්යේෂණ හා ප්‍රකාශන | 93,000 | 191,000 | 193,000 |
| මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘති | 8,623,000 | 10,305,000 | 5,878,000 |

එසේම ආයතනයේ සංයුක්ත සැලැස්මට අනුව හඳුනාගෙන ඇති ජාත්‍යන්තර මට්ටමේ විද්‍යාගාරයක් ස්ථාපිත කිරීම හා ශිෂ්‍ය නේවාසිකාගාරයක් ඉදි කිරීම වෙනුවෙන් අවශ්‍ය අරමුදල් රජය මගින් සම්පාදනය නොකෙරෙන බැවින් ඒ සඳහා අවශ්‍ය අරමුදල් රැස් කිරීමද කරනු ලැබේ. එබැවින් අදාල අරමුදල් තාවකාලිකව ආයෝජනය කිරීම තුලින් ආයතනය අපේක්ෂා කරනුයේ ආයතනයේ සියලුම එදිනෙදා ක්‍රියාකාරකම් සඳහා වියදම් මෙන්ම සංයුක්ත සැලැස්මේ හඳුනාගත් දිගුකාලීන පරමාර්ථ ඉටු කර ගැනීමයි.

**4.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

අ) විගණන වාර්තාවේ සඳහන් පුරප්පාඩු වී ඇති මහාචාර්ය තනතුරු හා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු පිරවීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත්කර ඇති අංක යූජීසී/එච්/ආර්/09/01/59 හා 19/03/2008 දිනැති ලිපිය අනුව ආයතනයේ අවශ්‍යතාවය මත උපයන ආදායමින් සිදු කිරීමට අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව අවශ්‍ය අවස්ථාවලදී කෙටි කාල සීමාවන් සඳහා මෙම තනතුරු සඳහා අධ්‍යයන මණ්ඩල වල නිර්දේශයන් යටතේ ආචාර්යවරුන් සේවයට බඳවා ගන්නා ලද අතර ඉදිරියේදී මෙම තනතුරු පිරවීමට කටයුතු කරනු ලැබේ. තවද ජ්‍යෙෂ්ඨ කතිකාචාර්ය - (ii ශ්‍රේණිය) තනතුරු වලින් එක් තනතුරක් සඳහා වන ප්‍රතිපාදන උපයෝගී කරගෙන ව්‍යාපාර කළමණාකරණ (MBA) සහ කෘෂිකර්ම ව්‍යාප්ත අධ්‍යයන මණ්ඩල සඳහා නිබන්ධකවරයන් (Tutor) දෙදෙනකු බඳවා ගෙන ඇත.

තවද විගණන වාර්තාවේ සඳහන් පුරප්පාඩු වී ඇති මහාචාර්ය තනතුරු හා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු පිරවීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ආයතනයේ අවශ්‍යතාවය මත උපයන ආදායමින් සිදු කිරීමට අනුමැතිය ලබා දී ඇති අතර ඒ සඳහා රජයේ මුදල් ප්‍රතිපාදන ලබා නොදේ. ඒ අනුව මෙම තනතුරු පිරවීමට කටයුතු කලහොත් ඒ වෙනුවෙන් වැටුප් ගෙවීමේදී දේශන ගාස්තු ගෙවීමට වඩා වැඩි මුදලක් ගෙවීමට සිදු වේ. එමෙන්ම පුරප්පාඩු වී ඇති තනතුරු කිහිපයෙන් පමණක් අධ්‍යයන මණ්ඩල 11 ක අදාල සියලුම පාඨමාලා පැවැත්වීමට හැකියාවක් නොමැති බැවින් බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබා ගැනිමට සිදුවී ඇත. එමෙන්ම අධ්‍යයන මණ්ඩල 11 ක සේවය සඳහා විවිධ වූ විෂය දැනුම ඇති ආචාර්යවරුන්ගේ අවශ්‍යතාවයන් පවතින බැවින් හා එක් එක් අධ්‍යයන මණ්ඩල විසින් උගන්වනු ලබන විෂය ඒකක ප්‍රමාණය අති විශාල බැවින් ආයතනයට ලබා දී ඇති පුරප්පාඩු වී පවතින තනතුරු පහෙන් එකී සියලු විෂය ඒකක ඉගැන්වීම කල නොහැකි බව සඳහන් කල හැකිය.

ආ) මෙම ආයතනයේ කෘෂිවිද්‍යා පුස්තකාලයේ සේවය කල ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිණිය සේවයෙන් විශ්‍රාම ලැබ අධ්‍යයන වර්ෂය අවසන් වන දිනය වන 2014.11.14 දින වන තෙක් සේවයේ යෙදී ඇත. ඒ හේතුවෙන් මෙම තනතුර පුරප්පාඩු වූයේ

| | | |
|---|---|---|
| | | 2014.11.14 දින සිට වන අතර එම පුරප්පාඩුව පිරවීම සඳහා 2014-10-24 දින පුවත්පත් දැන්වීමක් පල කරන ලදී. ඒ අනුව ලැබී තිබූ අයදුම් පත් 3 අතරින් එක් පුද්ගලයෙකු පමණක් සුදුසුකම් සපුරා තිබුණි. ඒ අනුව 2015-01-30 දින පැවති 211 අංක දරන කළමනාකරණ මණ්ඩල රැස්වීමේ ලබා දුන් අනුමැතිය මත පත් කරන ලද තේරීම් කමිටුව විසින් 2015-01-22 වන දින සම්මුඛ පරීක්ෂණයක් පවත්වන ලද අතර පුරප්පාඩු ගත තනතුරට බඳවා ගැනීමට තරම් ශක්‍යතාවයක් එම පුද්ගලයා පෙන්නුම් නොකල බැවින් එම තනතුර සඳහා බඳවා නොගැනීමටත් නැවත වරක් අයදුම් පත් කැඳවීමටත් තේරීම් කමිටුව විසින් කළ නිර්දේශය 27-02-2015 දින පැවති 212 අංක දරන කළමණාකරණ මණ්ඩලය විසින් අනුමත කරන ලදී. ඒ අනුව ආයතනය විසින් මෙම තනතුර සඳහා නැවත අයදුම්පත් කැඳවීමට කටයුතු කරන අවස්ථාවේදී පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සහ අනුබද්ධ සිය ආයතනවල පවතින සියලුම තනතුරු පිරවීමට ගත් තීරණයක් පරිදි මෙම ආයතනය විසින්ද යතෝක්ත පුරප්පාඩුව පිරවීම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ඉල්ලීමක් කරන ලදී. ඒ අනුව මේ වන විට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ නිර්දේශය සහ පාලක සභාවේ අනුමැතිය මත තේරීම් කමිටුවක් පත් කොට ඇති අතර 2016-06-25 පැවති පාලක සභා රැස්වීමේදී පුරප්පාඩු ගත තනතුර පිරවීම සඳහා කටයුතු කිරීමට අදාල අංශවලට උපදෙස් ලබාදී ඇත. මීට පෙර 2016-09-05 පැවැත්වීමට යෙදී තිබුණ සම්මුඛ පරීක්ෂනය උපකුලපතිවරයාට රාජකාරීමය වශයෙන් පැමිණීමට නොහැකි වූ බැවින් කල් දමන ලදී. මෙම තනතුර පිරවීම සඳහා සම්මුඛ පරීක්ෂනයක් 2016-10-28 දින පැවැත්වීමට සියලු කටයුතු සම්පාදනය කර ඇත. 2015 වසර අවසාන වනතුරු මෙම තනතුර පිරවීම සඳහා කටයුතු සිදු නොවුවද පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසින් යථෝක්ත තනතුර පිරවීම සඳහා නිසි පරිදි කටයුතු කොට 2017-02-01 වන දින අදාල පත්වීම් ලිපිය තෝරා ගත් සහකාර පුස්තකාලයාධිපතිනිය වෙත ලියාපදිංචි තැපෑලෙන් යවා ඇත. කෙසේ වෙතත් ඇය 2017-03-15 වන දින ඇය කෘෂිකර්ම පුස්තකාලයේ සේවයට වාර්තා කර ඇත. |
| | 5 | **ගිණුම් කටයුතුභාවය සහ යහ ප ාලනය** |
| | 5.1 | **අභ්‍යන්තර විගණනය** |
| | | කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොමැති අතර පේරාදෙණිය විශ්වවිද්‍යාලීය අභ්‍යන්තර විගණන ඒකකය මගින් මේ දක්වා අභ්‍යන්තර විගණන කාර්යය ඉටුකරනු ලබයි. පවතින සම්පත් උපරිම පරිදි යොදාගෙන විගණන වැඩ සටහන් පිළියෙල කරනු ලැබුවත් පේරාදෙණිය විශ්වවිද්‍යාලීය අභ්‍යන්තර විගණන අංශයට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මෙන්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේත් විගණන කාර්යයන් සිදු කල යුතු බැවින් විටක සැලසුම් කල පදිරි කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විගණන සැලැස්ම සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කල නොහැකි වන අවස්ථා පවතී. නමුත් වර්ෂයක ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ විගණන සැලසුම ඊට පසු වර්ෂ වලදී ක්‍රියාත්මක කිරීමට හා අභ්‍යන්තර පාලන පද්ධතියේ පවතින අඩුපාඩු නිවැරදි කිරීමට උපදෙස් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය මගින් ලබා දෙනු ලැබේ.<br><br>කාර්තුමය වශයෙන් අභ්‍යන්තර විගණන වාර්තාවන් ඉදිරිපත් කර නොමැති අතර 2015 වාර්ෂික විගණන සැලැස්ම 2014-12-31 දින පැවති 48 වන විගණන කමිටු රැස්විමට ඉදිරිපත් කර ඇත. මීට අමතරව 2015-06-16 දින පුස්තකාලයේ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයේ පරීක්ෂාව පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කර ඇත. |
| | 5.2 | **විගණන කමිටු** |
| | | ආ) 2015 වාර්ෂික වාර්තාවට ඇතුලත් කිරීම සඳහා විගණන නිරීක්ෂණ ඇතුලත් වාර්තාවක් යථෝක්ත වාර්ෂික වාර්තාවට ඉදිරිපත් කර ඇත. 2016-01-14 වැනි දින පැවති 52 වැනි විගණන කමිටුවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගෙන ඇත.<br>**(ඇමුණුම් 09)**<br><br>ආ), ඇ) භාණ්ඩ වට්ටෝරු සත්‍යාපන පිළිබඳ වාර්තාව, පුස්තකාල පොත් සත්‍යාපනය, ස්ථාවර වත්කම් ලේඛනය, වාර්ෂික විගණන සැලැස්ම, අභ්‍යන්තර විගණන නිලධාරියකු පත් කිරීම, විගණකාධිපති වාර්තාව, අභ්‍යන්තර පාලන පද්ධතිය, වාර්ෂික විගණන සැලැස්ම, පොදු |

ව්‍යාපාර පිළිබඳ කමිටු නිර්දේශයන් පිළිබඳව සමාලෝචනය සහ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳව එම වාර්තා ආයතනයට ලැබෙන ආකාරයට විගණන කමිටුවේ සහාගත කොට අවශ්‍ය නිර්දේශයන් කළමණාකරණ මණ්ඩලයට ඉදිරිපත් කොට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. ඒ අනුව පුස්තකාල පොත් පත් පරිහරණය පිළිබඳව අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් යෝජනා කොට දැනට ක්‍රියාත්මක කොට ඇත.

**5.3 ප්‍රසම්පාදන සැලැස්ම**

කෘෂිකර්මවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය සඳහා වාර්ෂිකව ලබාදෙනු ලබන භාණ්ඩාගාර ප්‍රතිපාදන ප්‍රමාණය වාර්ෂික පදනමකින් ලබා දෙන අතර ඒ අනුව වාර්ෂික අයවැය ලේඛණය හා වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස්කරනු ලැබේ. ඒ අනුව රජය මගින් ලබාදෙන ප්‍රතිපාදන ප්‍රමාණය නිශ්චිතව ඇස්තමේන්තු කළ නොහැකි බැවින් වසර 3ක් වැනි දීර්ඝ කාලයකට ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කිරීම ප්‍රායෝගික නොවන බැවින් වාර්ෂික පදනමෙන් සකස් කර ඇති බව දන්වා සිටිමි. තවද, රජයෙන් ලැබෙන ප්‍රතිපාදන නිශ්චිත නොවන බැවින් සහ එක් එක් වර්ෂ සඳහා ආයතනය විසින් ශිෂ්‍ය ලියාපදිංචි කටයුතු සහ අනෙකුත් කෙටි කාලීන පාඨමාලා සම්මන්ත්‍රණ මගින් උපයනු ලබන ආදායම එක් එක් වර්ෂය සඳහා වෙනස් වන බැවින් එක් එක් වර්ෂ සඳහා ආයතනයේ සහ අධ්‍යයන මණ්ඩල 11ක අවශ්‍යතා ඒ ඒ වර්ෂ වල ශිෂ්‍ය ලියාපදිංචි සංඛ්‍යාව හා කෙටි කාලීන පාඨමාලා පැවැත්වීමට සාපේක්ෂව වෙනස් වේ. ඒ අනුව, වර්ෂ 03ක් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීම කළ නොහැකිය.

2015 වර්ෂය සඳහා ආයතනයේ ප්‍රසම්පාදන සැලැස්ම වර්ෂය තුළ සිදු කරන ලද සියලුම ප්‍රසම්පාදන කටයුතු ඇතුලත්ව සවිස්තරාත්මක සැලැස්මක් ලෙස සකස් කර තිබූ බව දන්වා සිටින අතර ආයතනයේ හදිසි අවශ්‍යතාවයන් මත සිදු කළ මිලදී ගැනීම් ඇතුළත් කොට නැවත සංස්කරණය කල ප්‍රසම්පාදන සැලැස්මක් කළමණාකරණ මණ්ඩලයේ අනුමැතිය මත යාවත්කාලීන කර අදාල ආයතන වෙත අනුමැතිය සඳහාද ඉදිරිපත් කොට ඇත.

**5.4 අයවැය ලේඛණමය පාලනය**

(අ) i)

**අධ්‍යයන දීමනා** - 2015 වර්ෂය සඳහා වු ඇස්තමේන්තු සකස් කිරීමෙන් පසු නිකුත් කරන ලද 2014-12-21 දිනැති හා 2014/14 දරණ විශ්වවිද්‍යාල කොමිෂන් සභා චක්‍ර ලේඛය මගින් අධ්‍යයන දීමනාව 90% සිට 135% දක්වා වැඩිවීම හේතුවෙන් ඇස්තමේන්තුගත මුදලට වඩා සත්‍ය වියදම වැඩි වී ඇත.

**බාහිර දේශන ගාස්තු** - ආයතනයේ 2015 වර්ෂය සඳහා වන අයවැය ඇස්තමේන්තු 2014 වර්ෂය තුල සකස් කළද 2015 අධ්‍යයන වර්ෂය සඳා එක් එක් අධ්‍යයන මණ්ඩල වල අයවැය සකස් කරනු ලබන්නේ 2015 අධ්‍යයන වර්ෂයේ ශේෂය ලියාපදිංචි සංඛ්‍යාව පදනම් කර ගෙනය. ඒ අනුව අධ්‍යයනය කාර්ය මණ්ඩල සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී ශිෂ්‍ය සංඛ්‍යාව සහ පාඨමාලා ගාස්තු ඉහල යාම හේතුවෙන් බාහිර දේශන ගාස්තු ඉහල ගොස් ඇත. එබැවින් ඇස්තමේන්තු ගත බාහිර දේශන ගාස්තු වියදම ඉක්මවා වියදම් දැරීමට ආයතනයට සිදු වී ඇත.

**ලිපි ද්‍රව්‍ය වියදම්** - වර්ෂය තුළ අපේක්ෂිත ප්‍රමාණයට වඩා අත්‍යවශ්‍යය ලිපි ද්‍රව්‍ය මිලදී ගැනිම සඳහා වියදම් දැරීමට සිදු වීම එය 6% පමණ වියදම වැඩි විමකි.

**වෙනත් සැපයුම් සේවා** - අපේක්ෂිත ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක සැපයුම් සේවා ලබා ගැනීම හේතුවෙන් වියදම් දැරීමට සිදු විය.

**වාහන නඩත්තු කිරීම** - අපේක්ෂිත ප්‍රමාණය වඩා වැඩි ප්‍රමාණයක වාහන නඩත්තු කිරීමේ කටයුතු කිරීම හේතුවෙන් වියදම් දැරීමට සිදුවීම.

**යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීම** - අපේක්ෂිත ප්‍රමාණයට වඩා යන්ත්‍රෝපකරණ අලුත්වැඩිය කිරීමේ සේවා ගිවිසුම් ගාස්තු ඉහල යෑම හේතුවෙන්

අපේක්ෂිත ප්‍රමාණයට වඩා වියදම් දැරීමට සිදුවීම.

**මුද්‍රණ හා ප්‍රචාරනය** - පෙර වර්ෂවලට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ප්‍රචාරණ කටයුතු පුළුල් කිරීම හේතුවෙන් අපේක්ෂිත ප්‍රමාණයට වඩා වියදම දැරීමට හේතු වීම එය 6% පමණ වියදම වැඩි වීමකි..

**සංග්‍රහ වියදම** - පෙර වර්ෂවලට සාපේක්ෂව සමාලෝචික වර්ෂයේදී අපේක්ෂිත ප්‍රමාණයට වඩා විභාග හා රැස්වීම් පැවැත්වීම හේතුවෙන් සංග්‍රහ කටයුතු සඳහා වියදම් දැරීමට සිදුවීම.

ii)

**වැටුප් හා වේතන, UPF 15%, විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප්, ETF 15%, විශේෂ දීමනා 20%, ජීවන වියදම් දීමනා, අතිරේක දීමනා** - සමාලෝචිත වර්ෂය තුලදී පුරප්පාඩුව පැවති ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති, පරිගණක යෙදවුම් සහකාර, කම්කරු තනතුරු 02, සම්බන්ධීකාරක (මුල් මාස 6), රියදුරු යන තනතුරු වර්ෂය තුල පිරවීමට සැලසුම් කර අයවැය ඇස්තමේන්තු සකස් කර තිබුණද අපේක්ෂිත පරිදි පිරවීමට නොහැකි වී හේතුවෙන් අඩි වෙන් කිරීමක් සිදු විය.

**අතිකාල දීමනා** - විගණන කමිටුවේ හා කළමණාකරණ කමිටුවේ මගපෙන්වීම යටතේ විධිමත් සැලැස්මක් යටතේ සේවකයක් සේවයේ යෙදවීම තුළින් අතිකාල දීමනා ගෙවීම් සීමා කිරීම හේතුවෙන් අයවැය ගත වියදමට වඩා සත්‍ය වියදමේ අඩුවීමක් සිදුවී ඇත.

**සංග්‍රහ දීමනා**- ඇස්තමේන්තු සකස් කිරීමේදී සිදුවූ දෝෂයක් මත වැරදි මූලික වැටුපක් මත ගණනය කිරීම හේතුවෙන් අඩි වෙන් කිරීමක් සිදු වී ඇත.

**පාරිතෝෂිත ගෙවීම** - 2015 වර්ෂය සඳහා පාරිතෝෂිත වෙන් කිරීම රු.600,000 ක් වන අතර සංශෝධිත මූල්‍ය ප්‍රකාශන අනුව සත්‍ය වියදම රු.582,492 ක් වේ. මේ අනුව අධි වෙන් කිරීම රු.17,507ක් වන අතර එය මුලු ඇස්තමේන්තුවෙන් ප්‍රතිශතයක් ලෙස 3% ක විචලනයකි.

**දේශීය ගමන් වියදම්** - සමාලෝචිත වර්ෂය තුලදී රියදුරු පුරප්පාඩු පැවතිම මත ආයතනයේ බාහිර රාජකාරි පැවැති අවස්ථාවලදී එම රාජකාරි කාර්යයන් වැඩි ප්‍රමාණයක් එක් ගමන් වාරයකදී ඉටු කිරීමට කටයුතු කිරීම මත නිරන්තරයෙන් සිදුවූ බාහිර රාජකාරි ගමන් අඩු වීම සිදු විය. එබැවින් අදාල රියදුරු මහතුන් ලබා දුන් දීමනා අඩු වීම මත අදාල වියදමේ අධි වෙන් කිරීමක් සිදු වී ඇත.

**ඉන්ධන හා ලිහිසි තෙල්** - 2015 වර්ෂයේදී ඉන්ධන ගාස්තු මිල පහල යාමත් එසේම විශ්විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 10-03-2011 දිනැති 2/2011 චක්‍රලේඛ ප්‍රකාරව 2015 වර්ෂය සඳහා අයවැය ගත කර තිබූ නමුත් ඉහත චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන දීමනාව වැටුප් හා වේතන යටතේ වූ ඉන්ධන දීමනා යටතේ ගෙවීම හේතුවෙන් ඇස්තමේන්තුගත වියදමේ අධි වෙන් කිරීමක් සිදු වී ඇත.

**නිල ඇඳුම්** - පෙර වර්ෂයේදී නිල ඇඳුම් හිමි සේවකයන් හට වාර්ෂික දීමනාවක් ගෙවූ අතර එය පාදක කර ගෙන 2015 වර්ෂයේ ඇස්තමේන්තුව සකස් කර ඇත. නමුත් 2015 වර්ෂයේදී පෙර වර්ෂ පරිදිම නිල ඇඳුම් සඳහා රෙදි හා මැහුම් කුලී ගෙවීම මත මෙම වියදම අඩු වී ඇත.

**රසායනික ද්‍රව්‍ය හා වීදුරු බඩු** - කෘෂි ජීව විද්‍යා, ආහාර විද්‍යා හා තාක්ෂණ, පැළැටි සංරක්ෂණය යන අධ්‍යයන අංශ සඳහා අවශ්‍ය රසායනාගාර ද්‍රව්‍ය වීදුරු උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් 2015 වර්ෂයේ රු.1,950,000/ ක මුදලක් වෙන් කරන ලදී. රසායනික ද්‍රව්‍ය හා වීදුරු බඩු මිලදී ගැනීමේදී අදාල පිලිවිතරයන් සකස්

කිරීම, තාක්ෂණ කමිටු නියෝජනය කිරීම යනාදියට අදාල තාක්ෂණික ප්‍රවීනයන් ආයතනය සතුව නොමැති වීම සැලකිල්ලට ගෙන අදාල අධ්‍යයන අංශ විසින් කරන ලද ඉල්ලීම සැලකිල්ලට ගෙන 2015-05-29 දින පැවති අංක 214 දරණ කළමණාකරණ රැස්වීමේදී අදාල මුදල කෘෂිකර්ම පීඨය වෙත මාරු කර යැවීමට අනුමත කරන ලදී. ඒ අනුව 2015-06-18 දින රු. 1,713,568.71 ක මුදල පීඨය වෙත මාරු කිරීමට කටයුතු අදාල මුදලදින් වර්ෂය අවසානය වන විටත් දරා ඇත්තේ රු13,513.59 ක මුදලක් බැවින් ඇස්තමේන්තු ගත වියදමට වඩා සත්‍ය වියදම අඩු වී ඇත.

**ගොඩනැගිලි නඩත්තු වියදම්** - අපේක්ෂිත පරිදි සැලසුම් කල ගොඩනැගිලි අලුත්වැඩියා කටයුතු වර්ෂය තුල සිදු කිරීමට නොහැකි වීම හේතුවෙන් සත්‍ය වියදම අඩු වී ඇත.

**ප්‍රවාහන ගිවිසුම්ගත සේවා** - පෙර වර්ෂ වලදී ක්‍රියාත්මක වූ ව්‍යාපෘතීන් කිහිපයක් සමාලෝචිත වර්ෂයේදී අවසන් වීම හේතුවෙන් සිසුන්ගේ පර්යේෂණ කටයුතු අඩුවීම හේතුවෙන් ප්‍රවාහන ගිවිසුම් ගත සේවා වියදම අඩු වී ඇත.

**විදුලිය** - පෙර වර්ෂයේ විදුලිය භාවිතය පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තු ගත කලද විදුලි බිල පරිභෝජනයේ අඩු වීමක් සිදු වීම නිසා සත්‍ය වියදම අඩු වී ඇත.

**පවිත්‍රතා සේවා** - පිරිසිදු කිරීම හා නඩත්තු සේවා සිදුකරන ලද ආයතනය සමග ඇති කර ගන්නා ලද ගිවිසුමට අනුව ගෙවිය යුතු උපරිම මාසික බිල්පත් වටිනාකම පදනම් කරගෙන ඇස්තමේන්තු සකස් කළද ගෙවීම් සඳහා බිල්පත් ඉදිරිපත් කිරීමේදී සිදුකරන ලද කාර්යයේ ගුණත්වය හා සේවක නොපැමිනීම සැලකිල්ලට ගෙන අඩු බිල්පත් ගෙවීම හේතුවෙන් අධි වෙන් කිරීමක් සිදු වී ඇත.

**ජල ගාස්තු** - පේරාදෙණිය විශ්වවිද්‍යාලය පෙර වර්ෂවල එකම ජල පරිභෝජනයක් හා එකම මුදලක් බිල්පත්වල සටහන් කර තිබූ අතර එම වටිනාකම් සැලකිල්ලට ගෙන වර්ෂයේ ඇස්තමේන්තු සකස් කළද අදාල වර්ෂයේ හදුන්වා දෙනු ලැබූ නව මනු කියවීමේ ක්‍රමයකට අනුව පරිරිභෝජන ඒකක ප්‍රමාණය අඩු වීම මත වියදම අඩු වී ඇත.

**ආචාර්යවරුන්ගේ ගමන් වියදම්** - ගමන් වියදම් ඉල්ලීම් කරන බාහිර දේශකවරුන් ලෙස අධ්‍යයන මණ්ඩල කිහිපයක සේවය කරන ආචාර්යවරුන් කිහිපදෙනෙකු සමාලෝචිත වර්ෂයේදී අධ්‍යයන මණ්ඩලවල දේශකවරුන් ලෙස සේවය නොකිරීම හේතුවෙන් ගමන් වියදම්වල සත්‍ය වියදම ඇස්තමේන්තුගත වියදමට වඩා අඩු වී ඇත.

**විශේෂ සේවා/කවුන්සිල් කමිටු** - වර්ෂය අවසානයේ පවත්වනු ලබන කළමණාකරණ කමිටු රැස්වීම ආයතනයෙන් පිටස්තර ස්ථානයක පැවැත්වීමට සැලසුම් කර ඒ අනුව ඇස්තමේන්තු සකස් කළද අපේක්ෂිත පරිදි එම කාර්යය සිදු කිරීමට නොහැකි වීම හේතුවෙන් මෙම වැය ශීර්ෂයේ අධි වෙන් කිරීමක් සිදු විය.

**විශේෂ සේවා/ වෘත්තීය හා වෙනත් ගාස්තු** - පෙර වර්ෂය මත පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත කළද සත්‍ය වියදම අඩු වී ඇත.

**අධ්‍යයන පර්යේෂණ හා ප්‍රකාශන** - ආයතනයේ අධ්‍යාපනය හදාරන සිසුන්ගේ පර්යේෂණ එලි දැක්වීම වෙනුවෙන් ජාතික හා ජාත්‍යන්තර සමුළු වලට සහභාගී වීම වෙනුවෙන් අනුග්‍රහය දැක්වීමේ අරමුණෙන් මෙම වෙන් කිරීම සිදු කළද ඒ සඳහා පිළියෙල කරන ලද මාර්ගෝපදේශය කළමණාකරණ මණ්ඩලය අනුමත කරන ලද්දේ 2015-11-27 දින පැවති අංක 218 දරණ රැස්වීමේදීය. ඒ අනුව වර්ෂය තුළ ඉල්ලුම් කළද මාර්ගෝපදේශය ඒ වන විට අනුමත වී නොතිබීම හේතුවෙන් අධි වෙන් කිරීමක් සිදු වී ඇත.

| | | | |
|---|---|---|---|
| | | | **කාර්යය මණ්ඩල සංවර්ධනය** - වර්ෂය තුලදී කාර්යය මණ්ඩල සඳහා වැඩමුළු 2ක් පැවැත්වීමට අපේක්ෂා කළද එක් වැඩමුළුවක් පමණක පැවැත්වීම හේතුවෙන් අධි වෙන් කිරීමක් සිදු වී ඇත.<br><br>**පශ්චාත් පර්යේෂණ හා ශිෂ්‍යත්ව** - ආයතනයේ පර්යේෂණ උපාධි සඳහා ලියාපදිංචි සිසුන්ගේ සුලු පර්යේෂණ වියදම් සඳහා අනුග්‍රහය දැක්වීමේ අරමුණෙන් ප්‍රතිපාදන වෙන් කළද අපේක්ෂිත පරිදි ඉල්ලීම් නොකිරීම හේතුවෙන් සත්‍ය වියදමේ අඩුවක් සිදු වී ඇත.<br><br>**නිවාඩු බලපත්‍ර** - පෙර වර්ෂවල සත්‍ය වියදම පදනම් කරගෙන ඇස්තමේන්තු ගත කළද අපේක්ෂිත පරිදි වැය නොවූ හෙයින් අධි වෙන් කිරීමක් සිදු වී ඇත.<br><br>**බැංකු ගාස්තු** - පෙර වර්ෂවල සත්‍ය වියදම පදනම් කරගෙන ඇස්තමේන්තු ගත කළද අපේක්ෂිත පරිදි වැය නොවූ හෙයින් අධි වෙන් කිරීමක් සිදු වී ඇත.<br><br>**ත්‍යාග හා ප්‍රදාන**- සේවා කාලය අනුව පිරිනමන ත්‍යාග හා ප්‍රදාන පේරාදෙණිය විශ්වවිද්‍යාලය මගින් නිර්දේශ කරනු ලබයි. අදාල වර්ෂයට හිමිකම් තිබුණද එම ප්‍රදානයන් ලැබීමේ ප්‍රමාදයක් පවතින බැවින් ඉහත විචලතාවය ඇති වී ඇත.<br><br>**වැඩමුළු හා සම්මන්ත්‍රණ** - පෙර වර්ෂවල සත්‍ය වියදම පදනම් කරගෙන ඇස්තමේන්තු ගත කළද අපේක්ෂිත පරිදි වැය නොවූ හෙයින් අධි වෙන් කිරීමක් සිදු වී ඇත.<br><br>**මුද්දර ගාස්තු** - පෙර වර්ෂවල සත්‍ය වියදම පදනම් කරගෙන ඇස්තමේන්තු ගත කළද අපේක්ෂිත පරිදි වැය නොවූ හෙයින් අධි වෙන් කිරීමක් සිදු වී ඇත.<br><br>**හඳුන්වාදීමේ වියදම්** - පෙර වර්ෂවලට සාපේක්ෂව මෙම වසර තුලදී අපේක්ෂිත සිසුන් ලියාපදිංචියේ අඩු වීමක් සිදු වී ඇත. ඒ හේතුවෙන් අධි වෙන් කිරීමක් සිදු වී ඇත.<br><br>**වෙනත් පුනරාවර්තන වියදම** - පෙර වර්ෂවල සත්‍ය වියදම පදනම් කරගෙන ඇස්තමේන්තු ගත කළද අපේක්ෂිත පරිදි වැය නොවූ හෙයින් අධි වෙන් කිරීමක් සිදු වී ඇත. |
| | | (ආ) | **ගෘහ භාණ්ඩ නඩත්තු කිරීමේ වියදම්** - අබලන් හා කැඩී ගිය ගෘහ උපකරණ සඳහා සුලු අලුත්වැඩියා කිරීම් හා වේවැල් වලින් විවීම සඳහා මෙම ඇස්තමේන්තු සකස් කළද 2015 වර්ෂය තුළ මෙම කාර්යය ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය පුද්ගලයන් හා ආයතන ලබාගැණිම සඳහා ඇති අපහසුව මත එම කාර්ය ඉටු නොවිය එබැවින් ඒ සඳහා ගෙවීම් කිරීමක් සිදු වී නොමැත.<br><br>**කුලී වියදම්** - ඡායාපිටපත් මධ්‍යස්ථානයේ බිම් කුළිය හා අනෙකුත් වියදම් සඳහා ප්‍රතිපාදන ඇති කළද 2015 වර්ෂයේදී එම මධ්‍යස්ථානය ශිෂ්‍ය සුභ සාධක සංගමය වෙත ලබා දීම නිසා එහි කුළී ආදායම් නොලැබෙන අතර අදාල බිම් කුළිය හා අනෙකුත්වියදම් සංගමය විසින් සෘජුවම පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ගෙවනු ලබන බැවින් අදාල කුලී වියදම් සඳහා ආයතනයෙන් වියදම් දැරීමක් සිදු නොවීය.<br><br>**ව්‍යාපෘති වියදම්** - ආයතනය විසින් යෙෂුවා ටෙක් ආයතනය, සානා සමඟ ඇතිකර ගත් ගිවිසුමට අනුව සමාලෝචිත වර්ෂයේ දැරීමට අපේක්ෂාවෙන් ඇස්තමේන්තුගත කළද සමාලෝචිත වර්ෂය තුලදී යෙෂුවා ආයතනය වසින් දරන ලද වියදම් ආයතනය වෙත නොලැබුණු බැවින් වියදම් ගිණුම් ගත කිරීමක් සිදුවී නොමැත. |

| | | | |
|---|---|---|---|
| | | | **සංයුක්ත සැලැස්ම හා රජයේ වියදම්** - 2015-2019 කාල පරිච්ඡේදය සඳහා සකස් කරන ලද ආයතනයේ සංයුක්ත සැලැස්ම මුද්‍රණය කිරීමට සැලසුම්කර ඒ අනුව ප්‍රතිපාදන වෙන් කර තිබුණද අපේක්ෂිත පරිදි මෙම කාර්ය නිම කිරීමට නොහැකි වීම හේතුවෙන් වියදම් දැරීමක් සිදු වී නොමැත. |
| | | (ඈ) | **අන්තර්මාධ්‍ය දීමනාව** - මෙම දීමනාව ලබා දීමේදී සඳහන් කරන ලද්දේ ජීවන තත්වදර්ශකයට අනුව ගෙවනු ලබන ජීවන වියදම් දීමනාවට ඇතුලත් කරනු ලබන බවය. එබැවින් ඒ සඳහා ප්‍රතිපාදන ජීවන වියදම් දීමනාවට ඇතුලත් කර ඇත. මීට අමතරව පාද සටහනක් ලෙසද ඉදිරිපත් කරමි.<br><br>**වැඩ බැලීමේ දීමනාව** - මෙම ආයතනයේ සේවය කර 2014-11-30 දින සේවයෙන් විශ්‍රාම ගිය ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිනියගේ තනතුර සමාලෝචිත වර්ෂය තුලදී පිරවීමට අපේක්ෂා කළද සුදුසු අයදුම්කරුවකු සොයා ගැනීමට නොහැකි වීම හේතුවෙන් අදාල තනතුර වර්ෂය තුල පිරවීමට නොහැකි විය. ඒ අනුව මෙම තනතුරේ වැඩ බැලීම සඳහා කෘෂිකර්ම පීඨයට අනුයුක්ත සේවක කළ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරයෙකු පත්කල අතර කොමිෂන් සභා චක්‍රලේඛ 720 ප්‍රකාරව මූලික වැටුපෙන් 25% ක දීමනාවක් උපරිම කාල සීමාව වන මාස 06ක් සඳහා වැඩ බැලීමේ දීමනාව ලෙස ලබා දීමට කටයුතු කර ඇත.<br><br>**ඉන්ධන දීමනාව** - 2011-03-10 දිනැති අංක 2011/2 දරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන හා ලිහිසි තෙල් වැය ශීර්ෂය යටතේ ගෙවීම සඳහා ඇස්තමේන්තු සකස් කළද 2015-07-25 දිනැති 2015/09 දරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛය මගින් මෙම වැටුපට අදාල දීමනාවක් ලෙස ගෙවීමට උපදෙස් ලබා දී ඇති බැවින් ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු වී නොමැත. (ඇමුණුම අංක 10)<br><br>**වෙනත් ගිවිසුම්ගත සේවා** - 2015 වර්ෂයේ ඇස්තමේන්තු නොකලද වර්ෂය තුලදී වියදම දැරීමට සිදුවිය. මෙම තත්වය පාලනය කිරීමට ඉදිරියේදී කටයුතු කරමු.<br><br>**දේපළ ණය පොලී** - දේපළ ණය මත පොලී ප්‍රමාණයෙන් රජය මගින් ප්‍රතිපූරණය කරනු ලබන පොලී ප්‍රමාණය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පෙර වර්ෂවල ප්‍රතිපූරණය කළ බැවින් ඒ සඳහා වෙන් කිරීමක් සිදු නොකළද 2015 වර්ෂයේ සිට එසේ ප්‍රතිපූරණය නොකිරීම හේතුවෙන් එය ආයතනයේ වියදමක් ලෙස පෙන්නුම් කර ඇත.<br><br>Bench Fee - පෙර වර්ෂ වල දත්ත අනුව ඇස්තමේන්තු සකස් කිරීමේදී ප්‍රතිපාදන වෙන් නොකළද සමාලෝචිත වර්ෂයේදී මෙම වියදම දැරීමට සිදු වී ඇත.<br><br>**වෙනත් ප්‍රාග්ධන වියදම්** - 2014-06-30 දිනැති හා අංක 2014/05 දරණ කොමිෂන් සභා මුදල් චක්‍රලේඛය ප්‍රකාරව මානව ප්‍රාග්ධන සංවර්ධනය හා පර්යේෂණ සවිබල ගැන්වීම යන ශීර්ෂය යටතේ ප්‍රාග්ධන වියදම් ලෙස ඇස්තමේන්තු ගත කළ වැය ශීර්ෂයන්ට අදාලව සමාලෝචිත වර්ෂයේදී කරන ලද රු.5,877,850/ ක මුදල ආයතනයේ ගිණුම් ප්‍රතිපත්ති මගින් අනාවරණය කර ඇති පරිදි වර්ෂයේ වියදමක් ලෙස වෙනත් ප්‍රාග්ධන වියදම් ශීර්ෂය යටතේ කාර්ය සාධන ප්‍රකාශනයේ පෙන්නුම් කර ඇත. ඒ අනුව අයවැය ප්‍රතිපාදනයක් නොමැතිව මෙම වියදම් දැරීම සිදු කරඇත. |
| | | (ඇ) | **පශ්චාත් උපාධි සමාසික ගාස්තු** - 2008 වර්ෂයට පෙර ලියාපදිංචි සිසුන් පාඨමාලා නිම කිරීම මත ඔවුන්ගේ හිග ලියාපදිංචි ගාස්තු සියල්ලම අයකිරීම නිසා ලියාපදිංචි ගාස්තු ප්‍රමාණය වැඩි වී ඇත. |

| | | | |
|---|---|---|---|
| | | | **පශ්චාත් උපාධි පාඨමාලා ගාස්තු** - සමාලෝචිත වර්ෂය තුලදී අධ්‍යයන මණ්ඩල කිහිපයක පාඨමාලාවන් කිහිපයකට අදාලව පාඨමාලා ගාස්තු ඉහළ දැමීම හේතුවෙන් අපේක්ෂිත ප්‍රමාණය ඉක්මවා ආදායම් රැස් කිරීමක් සිදු වී ඇත.<br><br>**පශ්චාත් උපාධි විභාග ගාස්තු** - සමාලෝචිත වර්ෂයේ අපේක්ෂිත ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් විභාග සඳහා අයදුම් කිරීම හා ඒ වෙනුවෙන් විභාග ගාස්තු ගෙවීම නිසා අපේක්ෂිත ප්‍රමාණය ඉක්මවා ආදායම් රැස් කිරීමක් සිදු වී ඇත.<br><br>**පිටස්තර පුද්ගලයින්ට සේවා සැපයීම** - ආයතනය යටතේ ක්‍රියාත්මක පර්යේෂණ ව්‍යාපෘති කිහිපයක ආයතනයේ වාහන කුලී පදනම මත ලබා දීමෙන් ලද ආදායම අපේක්ෂිත ආදායමට වඩා ඉහල යෑම හේතුවෙන් වැඩි ආදායම් ප්‍රමාණයක් රැස් කර ඇත. |
| 6 | **පද්ධති හා පාලනයන්** | | |
| | යථෝක්ත විගණන විමසුමේ පෙන්වා දී ඇති පාලන ක්ෂේත්‍ර 2 පිළිබඳව අවධානය යොමු කොට හඳුනාගත් දුර්වලතාවයන් අවම කර ගැනීමට කටයුතු කරන්නෙමු. | | |

මහාචාර්ය එස් සමිත
අධ්‍යක්ෂක
කෘෂිකර්මවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය

පිටපත්: ලේකම් - විශ්වවිද්‍යාල උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය
සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
විගණන අධිකාරී - රජයේ විගණන අංශය
නියෝජ්‍ය අභ්‍යන්තර විගණක-පේරාදෙණිය විශ්වවිද්‍යාලය